**යුනියන් බැංකුවේ ක්‍රෙඩිට් කාඩ්පත් හිමියන් සඳහා වන එකඟතා ගිවිසුම**

සැලකිය යුතුයි:

යුනියන් බැංකුව (සමාගම් ලියාපදිංචි අංක No.PB 676PQ) විසින් නිකුත් කරන ලද ක්‍රෙඩිට් කාඩ්පත භාවිතා කිරීමට පෙර ඔබ යුනියන් බැංකුවේ ක්‍රෙඩිට් කාඩ්පත් හිමියන් සඳහා වන එකඟතා ගිවිසුම හොඳින් කියවා අවබෝධ කරගත යුතු ය. කාඩ්පත භාරගැනීමෙන්, ඒ මත අත්සන තැබීමෙන් හෝ කාඩ්පත භාවිතා කිරීමෙන් ඔබ පහත සඳහන් වගන්ති වලට අනුව කටයුතු කිරීමට එකඟ වූ ලෙස සැලකේ.

1. අර්ථ දැක්වීම්

1.1. 'අයදුම්කරු' යන්නෙන් යුනියන් බැංකුවේ ක්‍රෙඩිට් කාඩ්පත් සඳහා අයදුම් කළ පුද්ගලයෙකු/පුද්ගලයන් අදහස් වේ.

1.2. 'බැංකුව' හෝ 'යුනියන් බැංකුව' යන්නෙන් 'යුනියන් බෑන්ක් ඔෆ් කලම්බු පීඑල්සී' සමාගම සහ එහි අනුප්‍රාප්තිකයන් හා බලය හිමි පාර්ශව අදහස් වේ.

1.3. 'කාඩ්පත' හෝ 'ක්‍රෙඩිට් කාඩ්පත' යනු අයදුම්කරුගේ ඉල්ලීම මත යුනියන් බැංකුව විසින් නිකුත් කරන ලද ක්‍රෙඩිට් කාඩ්පතයි.

1.4 'කාඩ්පත් ගිණුම' යනු, මෙහි සඳහන් වගන්ති හා කොන්දේසි වලට අනුකූලව කාඩ්පත භාවිතා කිරීම සඳහා කාඩ්පත් හිමියා විසින් ආරම්භ කරන ලද සහ බැංකුව විසින් පවත්වාගෙන යනු ලබන ගිණුමයි.

1.5 'මුදල් අත්තිකාරම' යනු කාඩ්පත, කාඩ්පත් අංකය හෝ රහස්‍ය අංකය භාවිතා කිරීමෙන් ලබාගන්නා මුදලයි.

1.6 'මුදල් අත්තිකාරම් සීමාව' යන්නෙන් බැංකුව විසින් මුදල් අත්තිකාරම් සඳහා පනවා ඇති සීමාව අදහස් වේ.

1.7 'කාඩ්පත් හිමියා' යනු බැංකුව විසින් කාඩ්පතක් නිකුත් කරන ලද, එම කාඩ්පතේ හිමිකාරීත්වය දරන පුද්ගලයා ය.

1.8 'ගාස්තුව' හෝ 'ගනුදෙනුව' යනු කාඩ්පත භාවිතයෙන් සිදුකරන ලද හෝ කාඩ්පතෙන් අයකරගනු ලබන, සියලුම අදාළ බදු සහ වෙනත් අයකිරීම් ඇතුළත් ගනුදෙනුවක් වන අතර කාඩ්පත් හිමියා මෙම ගිවිසුමට අනුව, අදාළ මුදල් බැංකුව වෙත ආපසු ගෙවීමට එකඟ වේ.

1.9 'ණය සීමාව' යනු කාඩ්පත් හිමියාට ක්‍රෙඩිට් කාඩ්පත භාවිතයෙන් කළ හැකි වියදම් වල සීමාවයි.

1.10 'ගෙවිය යුතු අවම මුදල' යනු ගෙවීම් කළ යුතු දිනයේ හෝ ඊට පෙර ගෙවිය යුතු අවම මුදල ලෙස ගිණුම් ප්‍රකාශයේ දැක්වෙන මුදලයි.

1.11 'වෙළඳසැල' හෝ 'අලෙවිසැල' යන්නෙන් භාණ්ඩ හා සේවාවන් මිලදීගැනීමේදී කාඩ්පත මගින් ගෙවීම් භාරගැනීමට එකඟ වන ස්ථානයක් අදහස් වේ.

1.12 'කල් ඉකුත් වූ ගෙවීම්' යන්නෙන්, මීට පෙර ගිණුම් ප්‍රකාශ වල දක්වා තිබූ, එතෙක් නොගෙවන ලද මුදල් අතරින් ගෙවිය යුතු අවම මුදල අදහස් වේ. කල් ඉකුත් වූ ගෙවීම් ගිණුම් ප්‍රකාශය තුළ වෙනම දක්වනු ලබන අතර එම මුදල වහාම ගෙවිය යුතු ය.

1.13 'ගෙවීම් කළ යුතු දිනය' යනු බැංකුවට ගෙවීමට නියමිත මුළු මුදල හෝ ගෙවිය යුතු අවම මුදල ගෙවීම සඳහා ගිණුම් ප්‍රකාශයේ සඳහන් කර ඇති දිනය වේ.

1.14 රහස්‍ය අංකය/PIN අංකය යනු කාඩ්පතට අදාළව යුනියන් බැංකුව විසින් කාඩ්පත් හිමියා වෙත ලබා දී ඇති හෝ, කාඩ්පත් හිමියා විසින් වරින් වර තෝරාගනු ලබන විශේෂ අනන්‍යතා අංකයයි.

1.15 'ගිණුම්ගත වූ දිනය' යන්නෙන් කිසියම් ගනුදෙනුවක් සම්පූර්ණ වී එය කාඩ්පත් ගිණුමට ඇතුළත් වූ දිනය අදහස් වේ.

1.16 'මූලික කාඩ්පත් හිමියා' යනු බැංකුව විසින් ආරම්භ කළ හෝ ආරම්භ කිරීමට තීරණය කළ කාඩ්පත් ගිණුමේ නම සඳහන් පුද්ගලයා ය.

1.17 'අතිරේක කාඩ්පත් හිමියා' යනු මූලික කාඩ්පත් හිමියාගේ ඉල්ලීම පරිදි බැංකුව විසින් කාඩ්පතක් නිකුත් කරන ලද පුද්ගලයා වන අතර අදාළ කාඩ්පත මගින් කරනු ලබන ගනුදෙනු මූලික කාඩ්පත් හිමියාගේ ගිණුමට බැර වේ.

1.18 'ගිණුම් ප්‍රකාශය' යනු කාඩ්පත් ගිණුම සම්බන්ධයෙන් මූලික කාඩ්පත් හිමියා හෝ අතිරේක කාඩ්පත් හිමියා විසින් බැංකුව වෙත ගෙවනු ලැබිය යුතු මුදල් සම්බන්ධයෙන් බැංකුව විසින් එවනු ලබන මාසික වෙනත් කාලීන ගිණුම් ප්‍රකාශ වේ.

1.19 'ගෙවිය යුතු මුළු මුදල' යනු බැංකුවේ වාර්තා අනුව (කාඩ්පත් ගිණුමෙන් අයවිය යුතු සියලු ගාස්තු ඇතුළත්ව) බැංකුව වෙත ගෙවනු ලැබිය යුතු මුළු මුදලයි.

**02. නියමයන් හා කොන්දේසි**

2.1 නියමයන් හා කොන්දේසි යන්නෙන් මෙහි සඳහන් කර ඇති සහ/හෝ බැංකුව විසින් කලින් කලට පැනවීමට හා වෙනස් කිරීමට ඉඩ ඇති නියමයන් හා කොන්දේසි අදහස් වේ. මෙම නියමයන් හා කොන්දේසි තුළ, වෙනත් ස්ථානයක මීට වඩා වෙනස් ලෙස දක්වා නොමැති නම්, පහත සඳහන් කරුණු ඇතුළත් වනු ඇත.

i. 'වෙනස් කිරීම් හෝ සංශෝධනය කිරීම්' යන්නෙන් අතිරේකයන් එක්කිරීම්, වෙනස් කිරීම්, අලුත් කිරීම, ආදේශ කිරීම් සහ නැවත සම්මත කිරීම් අදහස් වන අතර 'වෙනස් කරන ලද/සංශෝධිත' යන්නෙන් එසේ වෙනස් කරන ලද නියමයන් හා කොන්දේසි ආදිය අදහස් වේ. 'බලය පැවරීම' හෝ 'අනුමත කිරීම' යන්නට බලය, අනුමැතිය, ඉඩ ලබා දීම, එකඟත්වය, අවසරය, බලපත්‍ර ලබාදීම, බැහැර කිරීම, ගොනුගත කිරීම සහ ලියාපදිංචි කිරීම ආදිය ඇතුළත් ය. 'නීතිය' යන්නෙන් නීතිරීති, ව්‍යවස්ථාවන්, නියාමන, අධිකරණ තීන්දු, බලය පැවරීම් හෝ ඕනෑම ආකාරයක අධිකරණ බලාධිකාරියක් මගින් ප්‍රකාශයට පත්කරන ලද මාර්ගෝපදේශන හා නියමයන් සහ රජය විසින් පනවන ලද සීමාවන් ආදිය අදහස් වන අතර, අයදුම් පත්‍රය භාරදුන් හෝ අත්සන් කළ දිනය වනවිට බලාත්මකව පැවති නීති සහ ඉන් අනතුරුව කලින් කලට කරනු ලබන සංශෝධන යටතේ අදාළ වන නීතිද ඇතුළත් වේ.

ii. ඒක වචන පද මගින් බහු වචනද හැඟවෙන අතර බහු වචන මගින් ඒක වචනද හැඟවේ.

iii. මෙම නියමයන් හා කොන්දේසි වලට අදාළ මාතෘකා ඒවා පරිශීලනය කිරීමේ පහසුව සඳහා පමණක් යොදා ඇති අතර මෙම නියමයන් හා කොන්දේසි අනුගමනය කිරීමේදී හා අර්ථකථනය කිරීමේදී ඒවා නොසලකා හැරිය යුතු ය.

iv. ''ඇතුළත්' සහ 'ඇතුළත්ව' යන වචන සීමාවන්ගෙන් තොරව අර්ථකථනය කළ යුතු ය.

v. ස්ත්‍රී හෝ පුරුෂ වාචක පද භේදයකින් තොරව පොදුවේ සියල්ලන් හැඟවීම සඳහා භාවිතා වේ.

2.2 කාඩ්පත සඳහා වන අයදුම්පත්‍රය මත අත්සන තැබීමෙන් සහ/හෝ කාඩ්පත මත අත්සන තැබීමෙන් සහ/හෝ කාඩ්පත භාවිතා කිරීම මගින් කාඩ්පත් හිමියා මෙම නියමයන් හා කොන්දේසි වලට අනුකූලව කටයුතු කිරීමට එකඟ වේ.

2.3 දැනට ක්‍රියාත්මක සහ කලින් කලට සංශෝධනය කරනු ලබන, ශ්‍රී ලංකාවේ අදාළ සියලුම නීති සහ විනිමය පාලන නියාමනයන්ට මෙන්ම අදාළ සියලුම රාජ්‍ය ප්‍රතිපත්ති සහ නියාමනයන්ට දැඩි ලෙස අනුකූලව කාඩ්පත භාවිතා කළ යුතු ය.

2.4 කිසියම් කරුණක්, සිදුවීමක්, අවස්ථාවක්, වෙනසක්, සාධකයක්, තොරතුරක්, ලිපිලේඛන, බලය පැවරීමක්, කටයුත්තක්, ක්‍රියාවක්, බැහැර කිරීමක්, කරුණු දැක්වීමක්, උල්ලංඝනය වීමක්, පැහැර හැරීමක් හෝ වෙනත් එබඳු දෙයක් සම්බන්ධයෙන් යුනියන් බැංකුව සහ කාඩ්පත් හිමියා අතර මතභේදයක් ඇතිවන්නේ නම්, එබඳු අවස්ථාවක යුනියන් බැංකුව දරන මතය අවසන් තීරණය ලෙස පිළිගැනීමට කාඩ්පත් හිමියා බැඳී සිටී.

**03. කාඩ්පත**

3.1 කාඩ්පත යුනියන් බැංකුව සතු දේපළක් වන අතර, බැංකුව විසින් ඉල්ලා සිටිනු ලබන අවස්ථාවකදී වහාම යළි බැංකුව වෙත භාරදිය යුතු ය.

3.2 අයදුම්කරුන්ට ණය පහසුකම් සැලසීමේ හැකියාව පරීක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයේ වාර්තාව සහ වෙනත් අදාළ වාර්තා ලබාගැනීමේ සහ එම වාර්තා අනුව ක්‍රෙඩිට් කාඩ්පත් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ අයිතිය යුනියන් බැංකුව සතු වේ.

3.3 කාඩ්පත් හිමියාගෙන් ලැබිය යුතු ගෙවීම් එකතු කිරීම සඳහා මූලික කාඩ්පත් හිමියාගේ නමින් ඉතුරුම් ගිණුමක් ආරම්භ කිරීමේ අයිතිය යුනියන් බැංකුව සතු ය. එම ගිණුම වෙනත් අරමුණක් සඳහා භාවිතා කිරීමට කාඩ්පත් හිමියාට අවසර නැත.

3.4 කාඩ්පතේ අයිතිය පැවරිය නොහැකි අතර එය මෙහි සඳහන් නියමයන් හා කොන්දේසි සහ, බැංකුව විසින් කලින් කලට පනවනු ලබන නියමයන් හා කොන්දේසි වලට යටත් වේ. කාඩ්පත මත මුද්‍රණය කර ඇති කල් ඉකුත් වීමේ දිනය දක්වා කාඩ්පත වලංගු වනු ඇත. පූර්ව දැනුම් දීමකින් තොරව කාඩ්පත අවලංගු කිරීමේ හෝ, කාඩ්පත සම්පූර්ණයෙන්ම හෝ යම් යම් විශේෂ අරමුණු සඳහා භාවිතා කිරීමේ අයිතිය අත්හිටුවීමේ පූර්ණ හිමිකම් යුනියන් බැංකුව සතු වන අතර, එසේ කිරීම මගින් මෙම ගිවිසුම යටතේ කාඩ්පත් හිමියා වෙත පැවරී ඇති වගකීම් වෙනස් නොවී දිගටම ක්‍රියාත්මක වේ. කාඩ්පත් හිමියා ස්වේච්ඡාවෙන් කාඩ්පත ආපසු බැංකුවට භාරදුන් අවස්ථාවකදී පවා, මෙම නියමයන් හා කොන්දේසි මගින් නියම කර ඇති වගකීම් සතුටුදායක ලෙස සපුරා ඇති බවට බැංකුව පිළිගන්නා තුරු එම වගකීම් එලෙසම ක්‍රියාත්මක වනු ඇත.

3.5 කාඩ්පත් හිමියා කාඩ්පත ලැබුණු සැණින් එහි පසුපස තම අත්සන තැබිය යුතු ය. වෙනත් අයෙකුට කාඩ්පත භාවිතා කිරීමට අවසර නොදිය යුතු අතර කාඩ්පත සුරක්ෂිත ලෙස තම භාරයේ තබාගත යුතු ය.

**04. අතිරේක කාඩ්පත**

4.1 මූලික අයදුම්කරු සහ අතිරේක අයදුම්කරු/අයදුම්කරුවන් විසින් ඉල්ලා සිටිනු ලබන අවස්ථාවකදී, සම්පූර්ණයෙන්ම ස්ව කැමැත්තට යටත්ව, තමන් විසින් කලින් කලට නියම කරනු ලබන නියමයන් හා කොන්දේසි අනුව බැංකුව විසින් අතිරේක කාඩ්පත් නිකුත් කිරීමට ඉඩ ඇත. මෙසේ අතිරේක කාඩ්පත/කාඩ්පත් ලබාගත් කාඩ්පත් හිමියා/හිමියන් සහ එසේ කාඩ්පතක් නිකුත් කිරීම අනුමත කළ කාඩ්පත් හිමියා එම කාඩ්පත/කාඩ්පත් භාවිතය සම්බන්ධයෙන් පොදුවේ සහ වෙන වෙනම වගකීම් දරයි. මූලික කාඩ්පත් හිමියා අඛණ්ඩව තම ගිණුම පවත්වාගෙන යන්නේ නම් පමණක් අතිරේක කාඩ්පත් වලංගු වේ.

4.2 මූලික කාඩ්පත් සහ අතිරේක කාඩ්පත් ලබාගත් වාර්ෂික සංවත්සර දින වලදී එම කාඩ්පත් වලට අදාළ වාර්ෂික ගාස්තු අයකෙරෙනු ඇත.

4.3 මූලික කාඩ්පත් හිමියා විසින් අතිරේක කාඩ්පත් වලට අඩු ණය සීමාවක් නියම කරන ලෙස උපදෙස් ලබාදී ඇති අවස්ථාවකදී හැර අනෙක් සියලුම අවස්ථා වලදී මූලික කාඩ්පත් හිමියාට සහ අතිරේක කාඩ්පත් හිමියන් සියලු දෙනාට පොදුවේ අදාළ ණය සීමාව බලපායි.

4.4 මූලික කාඩ්පත් හිමියා හෝ අතිරේක කාඩ්පත් හිමියා/හිමියන් වෙත යවන ලද සියලුම ලිපි හා දැනුම්දීම් දෙපාර්ශ්වය වෙතම යවන ලද හෝ දැනුම් දෙන ලද ලෙස සැලකේ.

4.5 මූලික කාඩ්පත් හිමියාගේ හෝ අතිරේක කාඩ්පත් හිමියෙකුගේ අවසරය රහිතව, අතිරේක කාඩ්පත් හිමියෙකුට අදාළ කාඩ්පත් ගිණුමේ තොරතුරු පරීක්ෂා කිරීමට බැංකුවට අවසර ඇති බවට ප්‍රාථමික කාඩ්පත් හිමියා එකඟ වේ. තම අභිමතය පරිදි, කාඩ්පත් ගිණුම සම්බන්ධ තොරතුරු ඕනෑම අතිරේක කාඩ්පත් හිමියෙකු වෙත ලබාදීම සඳහා මූලික කාඩ්පත් හිමිකරු අවසරය ලබාදී ඇත. එහෙත් එසේ සිදුකිරීම සඳහා බැංකුව බැඳී නොමැත.

4.6 මූලික ගිණුම් හිමියා විසින් ලිඛිත ඉල්ලීමක් කරන ලද පසුව පමණක් අතිරේක කාඩ්පත් ගිණුමක් අවලංගු කිරීම සිදුකෙරේ.

**05. කාඩ්පත් හිමියන් වෙත කාඩ්පත් යැවීම**

කාඩ්පත/කාඩ්පත් කුරියර් සේවාවක් මගින් මූලික කාඩ්පත් හිමියා සහ අතිරේක කාඩ්පත් හිමියා/හිමියන් වෙත යැවීමට ඉඩ ඇත. මෙසේ කාඩ්පත යවනු ලැබූ විට ඔවුන් තම අනන්‍යතාව සහතික කර කාඩ්පත ලබාගත යුතු ය. තමන්ගේ අභිමතය පරිදි කාඩ්පත භාරගැනීම සඳහා වෙනත් පුද්ගලයෙකුට අවසර ලබාදීමට කාඩ්පත් හිමියන්ට හැකියාව ඇති අතරම කාඩ්පත භාරගත් මොහොතේ පටන් ඇතිවන සියලු ගාස්තු සඳහා කාඩ්පත් හිමියන් වගකිව යුතු වේ. කාඩ්පත් හිමියාගේ නියෝජිතයෙකු ලෙස සලකනු ලබන තුන්වන පාර්ශවයක් වෙත කාඩ්පත භාරදීමේ අයිතිය බැංකුව හෝ එහි නියෝජිතයන් සතු ය. එසේ කාඩ්පත භාරදුන් මොහොතේ පටන් අදාළ වන සියලුම ගාස්තු වලට කාඩ්පත් හිමියා වගකිව යුතු වේ.

## 06. කාඩ්පත භාවිතා කිරීම

6.1 ලොව පුරා VISA කාඩ්පත් පිළිගන්නා වෙළඳසැල්, වෙබ් අඩවි සහ ATM යන්ත්‍ර වලදී කාඩ්පත භාවිතා කළ හැක. කිසියම් සේවාවක් ලබාගැනීමේදී කාඩ්පත මගින් ගෙවීම් කරනු ලබන්නේ නම්, එම ගෙවීමට අදාළ ලදුපත අත්සන් තබන අවස්ථාවේදී එම ලදුපතේ පිටපතක් ලබාගැනීමට කාඩ්පත් හිමියා කටයුතු කළ යුතු ය. සාමාන්‍යයෙන් බැංකුව විසින් කාඩ්පත් හිමියා වෙත ගාස්තු සම්බන්ධ වෙනත් ලදුපත් නිකුත් කිරීමක් සිදු නොකරයි.

කෙසේ වුවද, බැංකුවේ අභිමතය පරිදි, බැංකුව විසින් තීරණය කරන ලබන ගාස්තු වලට යටත්ව, අදාළ ගාස්තු සම්බන්ධ පිටපත් ලබාගැනීමේ හැකියාව පවතිනු ඇත. දුරකථන මගින්, තැපැල් මගින් හෝ අන්තර්ජාලය ඔස්සේ කරනු ලබන මිලදීගැනීම් සම්බන්ධයෙන් බැංකුව අදාළ ගාස්තු පත්‍රිකා නිකුත් කිරීමට ඉඩ ඇති බවත්, එබඳු අවස්ථා වලදී කාඩ්පත භාවිතා කිරීමේදී කාඩ්පත් හිමියා අදාළ ලදුපත් සඳහා තම අත්සන යොදා නොතිබීමට ඉඩ ඇති බවත් කාඩ්පත් හිමියා පිළිගනී. ඒ අනුව, ඕනෑම හේතුවක් මත එබඳු ගනුදෙනුවක නිරවද්‍යභාවය හෝ වලංගුභාවය සම්බන්ධයෙන් මතභේදයක් පැනනැගී ඇති අවස්ථාවකදී පවා, කාඩ්පත් හිමියා විසින් අදාළ හිඟ මුදල සම්පූර්ණයෙන්ම බැංකුව වෙත පියවිය යුතු බවටද කාඩ්පත් හිමියා එකඟ වේ. එබඳු මතභේදයක් පැනනැගුණෝ නම් කාඩ්පත් හිමියා සහ අදාළ ව්‍යාපාරික ආයතනය විසින් එම මතෙභේදය විසඳා ගත යුතු ය.

6.2 සත්‍ය වශයෙන් පෞද්ගලික හෝ රාජකාරිමය අරමුණු සඳහා පමණක් කාඩ්පත භාවිතා කළ යුතු අතර වාණිජමය ප්‍රමාණයන්ගෙන් භාණ්ඩ මිලදීගැනීමට/ආනයනය කිරීමට හෝ ප්‍රාග්ධන ගනුදෙනු සඳහා කාඩ්පත භාවිතා කිරීමට අවසර නැත. තවද නීතිවිරෝධී කටයුතු සඳහා කාඩ්පත භාවිතා නොකළ යුතු ය. ගෙවීම් කර නොමැති නම් හෝ සැකකටයුතු ක්‍රියාකාරකම් සිදුවන බවක් හැඟී යන්නේ නම් කාඩ්පත භාවිතයෙන් සිදුකරනු ලබන ඕනෑම ගනුදෙනුවක් හෝ සියලුම ගනුදෙනු ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය බැංකුව සතු ය.

6.3 කාඩ්පත ජාත්‍යන්තර මට්ටමින් වලංගු වන අතර, එය භාවිතා කිරීමේදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියම කර ඇති සීමාවන් ඉක්මවා යන්නේ නම්, ඒ සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ අවසරය ලබාගැනීමේ සහ එහි නියමයන්ට අනුව කටයුතු කිරීමේ වගකීම කාඩ්පත් හිමියා භාරගනී.

6.4 ලොතරැයි මිලදී ගැනීම, සූදු සම්බන්ධ ගනුදෙනු, විදේශ විනිමය හුවමාරු හෝ වැඩිහිටියන්ට පමණක් වූ තහනම් සේවාවන් මිලදීගැනීම සඳහා කාඩ්පත් අන්තර්ජාලය තුළ හෝ වෙනත් ස්ථානයකදී භාවිතා කිරීමෙන් වැළකිය යුතු ය.

6.5 කාඩ්පත ඇතුළු කිරීම අවශ්‍ය නොවන වර්ගයේ යන්ත්‍ර සූත්‍ර භාවිතයෙන්, කාඩ්පත් 'ටැප්' කිරීමෙන් හෝ සමීප කිරීමෙන් ගෙවීම් කළ හැකි වන තාක්ෂණයක් කාඩ්පතට ඇතුළත් වී ඇති බව කාඩ්පත් හිමියා පිළිගනී. මේ ආකාරයට සිදුකරනු ලබන ගනුදෙනු 'Contactless Transactions' හෝ 'Paywave Transactions' ලෙස හැඳින්වේ.

6.6 කාඩ්පත ඇතුළු කිරීමන් තොරව ගෙවීම් භාරගත හැකි පහසුකම් සහිත ස්ථාන වලදී, බැංකුව විසින් කලින් කලට නියම කරනු ලබන සීමාවන්ට යටත්ව එම ආකාරයට ගෙවීම් සිදුකළ හැකි වන අතර පහත සඳහා අවශ්‍යතා වලින් තොරව අදාළ ගනුදෙනුව සම්පූර්ණ කළ හැකි වේ.

අ. චුම්බක දත්ත කියවන යන්ත්‍රයකට කාඩ්පත ඇතුළු කිරීම

ආ. කාඩ්පතේ 'චිප්' එක තුළ ඇති දත්ත කියවන යන්ත්‍රයක් භාවිතා කිරීම

ඇ. ගනුදෙනුව තහවුරු කිරීම සඳහා කාඩ්පත් හිමිකරුගේ අත්සන යෙදීම හෝ රහස්‍ය අංකය ඇතුළත් කිරීම

6.7 විදේශ ගනුදෙනු සිදුකිරීමේදී කාඩ්පත ඇතුළු කිරීමෙන් තොරව සිදුකරන ගනුදෙනු සඳහා අදාළ වන සීමාවන් රටින් රටට වෙනස් විය හැක.

6.8 Dynamic Currency Conversion (DCC) යනු තෝරාගත් අලෙවිසැල් සහ ATM යන්ත්‍ර වෙතින් ලබාගත හැකි, විදේශ සංචාරයන්හිදී වැදගත් වීමට ඉඩ ඇති සේවාවකි. මෙම සේවාව මගින් විදේශ මුදල් මගින් සිදුකරනු ලබන ගනුදෙනු, අදාළ ගනුදෙනුව සිදුවන ස්ථානයේදී කාඩ්පත් ගිණුමක මුදල් (ශ්‍රී ලංකා රුපියල්) බවට පරිවර්තනය කරනු ලබයි. මෙසේ DCC සේවාව හරහා විදේශ ගනුදෙනු ශ්‍රී ලංකා මුදල් බවට හැරවීමට කාඩ්පත් හිමියා කැමති නම්, එම ගනුදෙනුවට අදාළ වන විනිමය හුවමාරු ක්‍රමවේදය සහ අනුපාතය අදාළ අලෙවිසැල හෝ ATM සේවාව සපයන සමාගම විසින් තීරණය කරනු ලබන බව කාඩ්පත් හිමියා පිළිගනී.

6.9 කාඩ්පත සඳහා 'Verified by Visa' ලෙස හැඳින්වෙන 3D-Secure තාක්ෂණය ස්වයංක්‍රියවම භාවිතා වන බවත්, එම නිසා අන්තර්ජාලය ඔස්සේ කරනු ලබන ඇතැම් ගනුදෙනු සඳහා එක්වරක් පමණක් භාවිතා කරනු ලබන මුරපදයක් අවශ්‍ය බව කාඩ්පත් හිමියා දන්නා අතර ඔහු/ඇය ඊට එකඟ වේ. මෙසේ තහවුරු කිරීම අසාර්ථක වීම නිසා කිසියම් ගනුදෙනුවක් සම්පූර්ණ කළ නොහැකි වන්නේ නම් ඊට බැංකුව හෝ අදාළ ව්‍යාපාරික ආයතනය වග නොකියයි. කාඩ්පත් හිමියා වෙත ලැබෙන එක් වරක් පමණක් භාවිතා කළ හැකි මුරපදය එය වලංගු කාලය තුළ කාඩ්පතේ සාමාන්‍ය රහස්‍ය අංකය පරිදිම ආරක්ෂා කරගත යුතු අතර බාහිර පාර්ශ්වයකට එය හෙළි කිරීමෙන් වැළකිය යුතු ය.

6.10 බැංකුව විසින් කාඩ්පත් හිමියා වෙත දැනුම් දී ඇති ණය සීමාව තුළ පමණක් කාඩ්පත භාවිතා කළ යුතු අතර කාඩ්පත මත මුද්‍රණය කර ඇති මාසයේ අවසන් දිනයට පසුව කාඩ්පත භාවිතා නොකළ යුතු ය.

6.11 අලෙවිසැල් හෝ වෙනත් ව්‍යාපාරික ස්ථාන මගින් කාඩ්පත පිළිගනු ඇතැයි යන්න සම්බන්ධයෙන් බැංකුව කිසිදු ආකාරයක සහතිකයක් ලබා නොදෙන අතර එසේ කාඩ්පත ප්‍රතික්ෂේප වූ අවස්ථාවකදී ඒ සම්බන්ධයෙන් කිසිදු වගකීමක්ද නොදරයි.

6.12 බැංකුව විසින් කිසියම් ගනුදෙනුවක් සැකකටයුතු හෝ සාමාන්‍ය කාඩ්පත් හිමියෙකු විසින් සිදු නොකරනු ලබන ආකාරයේ ගනුදෙනුවක් ලෙස සැකකරනු ලබන ගනුදෙනුවක් නිරීක්ෂණය කරන ලද අවස්ථාවකදී ආරක්ෂක පියවරක් වශයෙන් එම ගනුදෙනු ප්‍රතික්ෂේප කරනු ලැබීමට ඉඩ ඇත. කාඩ්පත භාවිතා කර සිදුකරනු ලබන ගනුදෙනු තහවුරු කරගැනීම සඳහා බැංකුව කලින් කලට මූලික කාඩ්පත් හිමියා සහ අතිරේක කාඩ්පත් හිමියන්ගෙන් කරුණු විමසීමට කටයුතු කරනු ඇත.

6.13 කාඩ්පත් හිමියා විසින් තැපැල් මගින් ඇණවුම් කරනු ලබන භාණ්ඩ, වගකීම් හෝ සේවාවන් ප්‍රමාද වීම, නොලැබීම හෝ හානි වූ භාණ්ඩ ලැබීම යනාදී කරුණු සම්බන්ධයෙන් බැංකුව කිසිදු වගකීමක් නොදරයි. කාඩ්පත් පහසුකම යනු කාඩ්පත් හිමියාට භාණ්ඩ හා සේවාවන් මිලදීගැනීම සඳහා සපයන ලද පහසුකමක් පමණක් බවත්, එම භාණ්ඩ හා සේවාවන්ගේ ප්‍රමිතිය, ප්‍රමාණය, එම භාණ්ඩ හෝ සේවාවන් ලැබීම යනාදිය සම්බන්ධයෙන් බැංකුව කිසිදු වගකීමක් හෝ නියෝජනයක් නොදරන බවත්, ගනුදෙනුව සම්බන්ධයෙන් මතභේදයක් ඇතිවන්නේ නම් කාඩ්පත් හිමියා සහ ගනුදෙනුව සිදුකරන ව්‍යාපාරික ආයතනය එය විසඳාගත යුතු බවත් පැහැදිලිව අවබෝධ කරගත යුතු ය. එබඳු මතභේදයක් පැවතීම නිසා බැංකුවට ගෙවිය යුතු ගාස්තු සම්බන්ධ වගකීම් වලින් කාඩ්පත් හිමියා නිදහස් නොවන අතර එබඳු මතභේදයක් සම්බන්ධ විරෝධතා පැවතියදී පවා අදාළ ගාස්තු නිසි පරිදි පියවීමට කාඩ්පත් හිමියා එකඟ වේ.

6.14 කාඩ්පත් හිමියා හෝ බැංකුව විසින් කාඩ්පත අවලංගු කරන ලද අවස්ථාවකදී සහ කාඩ්පත නැතිවී/අයථා ලෙස භාවිතා කර ඇති අවස්ථාවකදී කාඩ්පත් හිමියාට කාඩ්පත භාවිතා කිරීමට ඇති අයිතිය සම්බන්ධයෙන් වහාම තීරණය කෙරෙනු ඇත.

6.15 බැංකුව විසින් නැවත දැනුම් දෙන තුරු, සම්පූර්ණයෙන් බැංකුවේ අභිමතය පරිදි සෑම කාඩ්පත් හිමියෙකු සඳහාම කාඩ්පත් අලුත් කිරීම සහ අවලංගු වූ කාඩ්පත් වෙනුවට නව කාඩ්පත් නිකුත් කිරීම සඳහා තමන් විසින් ස්ථාවර ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති බවට කාඩ්පත් හිමියා එකඟ වේ. කාඩ්පත් කල් ඉකුත් වීම, අස්ථානගත වීම, හානි වීම හෝ සොරාගනු ලැබීම නිසා නව කාඩ්පතක් නිකුත් කරන්නේද යන්න සම්බන්ධ පූර්ණ අයිතිය බැංකුව සතු ය. එසේ කාඩ්පත නැවත අලුත් නොකරනු ලබන අවස්ථාවකදී කාඩ්පත් හිමියා වහාම සියලු හිඟ මුදල් බැංකුව වෙත ගෙවීමට කටයුතු කළ යුතු වේ.

6.16 කාඩ්පත් හිමියා විදේශ රටක් වෙත සංක්‍රමණය වීමේදී, නිත්‍ය රැකියාවක් සඳහා විදේශගත වීමේදී සහ පවතින විනිමය පාලන රෙගුලාසි අනුව 'අනේවාසික' ලෙස තීරණය කරනු ලැබීමේදී තමන් සතු මූලික කාඩ්පත සහ සියලු අතිරේක කාඩ්පත් නැවත බැංකුව වෙත භාරදිය යුතු අතර ඒවාට අදාළ සියලු හිඟ මුදල් පියවිය යුතු ය.

6.17 තම නමේ හෝ ලිපිනයේ වෙනසක් සිදුවන්නේ නම් කාඩ්පත් හිමියා වහාම ඒ බව බැංකුව වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

6.18 ක්‍රෙඩිට් කාඩ්පත් වැඩසටහන සමාප්ත කරනු ලබන අවස්ථාවකදී හෝ කාඩ්පත අලුත් කළ යුතු අවස්ථාවකදී, කාඩ්පත් හිමියා එතෙක් භාවිතා කළ කාඩ්පත් වර්ගයට වඩා වෙනස් වර්ගයේ කාඩ්පතක් නිකුත් කිරීමේ පූර්ණ අයිතිය යුනියන් බැංකුව සතු වේ. එම කාඩ්පතට අදාළ මුදල් සීමාව සහ ණය සීමාව ආදිය තීරණය කිරීමේ පූර්ණ අයිතියද යුනියන් බැංකුව සතු ය.

6.19 කාඩ්පත සහ යුනියන් බැංකුව සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී කාඩ්පත් හිමියා සෑම විටම යහපත් විශ්වාසය පෙරදැරිව කටයුතු කළ යුතු වේ.

**07. පෞද්ගලික අනන්‍යතා අංකය**

මූලික කාඩ්පත් හිමියා සහ අතිරේක කාඩ්පත් හිමියා/හිමියන් වෙත පෞද්ගලික අනන්‍යතා අංකයක් හෙවත් රහස්‍ය අංකයක් (PIN) බැංකුවේදී ලබාදීමට, ලියාපදිංචි/සාමාන්‍ය තැපැල් මගින් එවීමට හෝ කුරියර් සේවාවක් මගින් එවීමට බැංකුව කටයුතු කරනු ඇත. එය ලැබුණු විට එය කාඩ්පත් හිමියාගේ හිමිකාරීත්වය යටතට පත්වන අතර එහි ආරක්ෂාව තහවුරු කිරීම සඳහා කාඩ්පත් හිමියා හැකි සෑම පියවරක්ම ගත යුතු ය.

මෙම (PIN) අංකය සුරක්ෂිත පද්ධතියක් තුළ මුදල් හුවමාරු සඳහා අවස්ථාව හිමි කර දෙන අතර කාඩ්පත් සඳහා සිදු කෙරෙන පහත දැක්වෙන සේවා සම්පූර්ණ කිරීම සඳහා එය අවශ්‍ය වේ.

1. දේශීයව හෝ ජාත්‍යන්තර වශයෙන් ඕනෑම VISA ATM (ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රය) යන්ත්‍රයකින් සිදුකරන මුදල් අත්තිකාරම් හෝ ශේෂ පිරික්සීම් ආදී ක්‍රියාකාරකම් සඳහා.

2. විශේෂයෙන් විදෙස් තොරාගත් වෙළඳසැල් වල විකුණුම් ස්ථාන වලදී POS සිදු කරන මුදල් හුවමාරු වලදී PIN අංකය අවශ්‍ය වේ.

**08. අනේවාසික පුද්ගලයන්ට සහ විදේශිකයන්ට කාඩ්පත් නිකුත් කිරීම**

8.1 ශ්‍රී ලංකාවේ ජීවත් වන්නේ නම් විදේශ ජාතිකයෙකුට වුවද කාඩ්පතක් සඳහා අයදුම්කිරීමේ සහ කාඩ්පත භාවිතා කිරීම හැකියාව පවතී. එම කාඩ්පත් හිමියා නිත්‍ය වශයෙන් රට හැර යාමට මාසයකට පෙර සහ/හෝ තම නේවාසික වීසා කල් ඉකුත් වීමට මාසයකට පෙර බැංකුවට ඒ බව ලිඛිතව දැනුම් දිය යුතු ය. ඉහත සඳහන් සීමාවන් එළඹීමට පෙර බැංකුවට ගෙවීමට සියලු මුදල් ගෙවා අවසන් කළ යුතු වේ.

8.2 අනේවාසික පුද්ගලයෙකුට කාඩ්පතක් නිකුත් කළ හැක්කේ ඔහු/ඇය බැංකුව සතුටුදායක ලෙස පිළිගන්නා ආකාරයට අනේවාසික විදේශ මුදල් ගිණුමක් සක්‍රීයව පවත්වාගෙන යනු ලබන්නේ නම් සහ එබඳු ගිණුමක් භාවිතයෙන් ක්‍රෙඩිට් කාඩ් ගාස්තු විදේශ මුදල් වලින් ගෙවීමට කටයුතු කරන්නේ නම් පමණි.

## 09. ණය සීමාව

9.1 බැංකුව විසින් කාඩ්පත් ගිණුම සඳහා ණය සීමාවක් පනවනු ලබන අතර, එය කාඩ්පත සමග නිකුත් කරනු ලබන ආවරණ ලිපියෙහි සහ ඉන් පසු කලින් කලට එවනු ලබන ගිණුම් ප්‍රකාශයන්හි සඳහන් කර තිබෙනු ඇත. ණය සීමාව කලින් කලට වැඩි කිරීමට හෝ අඩු කිරීමට බැංකුව කටයුතු කරනු ඇති අතර ඒ බව කාඩ්පත් හිමියා වෙත දැනුම් දෙනු ලැබේ. එසේ ණය සීමාව වැඩි කිරීම හෝ අඩු කිරීම මගින් කාඩ්පත් හිමියාට ඇතිවන කිසිදු ආකාරයක අලාභයක් හෝ හානියක් සම්බන්ධයෙන් බැංකුව කිසිදු ආකාරයකින් වග නොකියයි.

9.2 කාඩ්පත් හිමියාගේ ණය සීමාව නිත්‍ය වශයෙන් වැඩි කිරීමට පියවර ගනු ලබන්නේ නම් ඒ බව කෙටි පණිවිඩයක් මගින්, ලිපියක් මගින් හෝ දුරකථන ඇමතුමක් මගින් දැනුම් දීමට බැංකුව කටයුතු කරනු ඇත. ඒ සම්බන්ධයෙන් ගිණුම් හිමියා එකඟ නොවන්නේ නම් ඒ බව වහාම බැංකුව වෙත දැනුම්දීම ඔහුගේ/ඇයගේ වගකීමකි. එවැනි විරුද්ධත්වයක් ඉදිරිපත් නොකරන්නේ නම් කාඩ්පත් හිමියා ණය සීමාව ඉහළ නැංවීම සම්බන්ධයෙන් එකඟත්වය පළකළ ලෙස සැලකේ.

9.3 ගිණුමේ පවතින ශේෂය ණය සීමාව ඉක්මවා ගොස් ඇත්නම් කාඩ්පත් හිමියා වහාම එම ගාස්තු පියවීමට කටයුතු කළ යුතු ය. ණය සීමාව ඉක්මවා යන අවස්ථා වලදී, එසේ ඉක්මවා යන ප්‍රමාණය සැලකිල්ලට ගැනීමකින් තොරව, ඒ සඳහා ගාස්තුවක් කාඩ්පත් ගිණුමට පැනවීමට බැංකුව කටයුතු කිරීමට ඉඩ ඇත.

9.4 කාඩ්පතට අදාළ වන මුදල් අත්තිකාරම් සීමාව තෙක් මුදල් අත්තිකාරම් ලබාගැනීමට කාඩ්පත් හිමියන්ට හැකියාව ඇත. තාවකාලිකව ණය සීමාව ඉහළ නැංවීම සහ/හෝ කාඩ්පත් ගිණුමට මුදල් තැන්පත් කිරීම හා වෙනත් ගිණුමකින් මුදල් මාරු කිරීම මගින් කිසි විටෙකත් මුදල් අත්තිකාරම් සීමාව ඉහළ නොයයි. කාඩ්පත් හිමියාට පූර්ව දැනුම්දීමක් සිදුකිරීමෙන් තොරව මෙම පහසුකම වෙනස් කිරීමේ හෝ ඉවත් කරගැනීමේ අයිතිය බැංකුව සතු ය.

## 10. ගාස්තු

10.1 බැංකුවේ ඉල්ලීම පරිදි, මූලික කාඩ්පත නිකුත් කිරීමේදී සහ අතිරේක කාඩ්පත් නිකුත් කිරීමේදී බැංකුව වසින් නියම කරනු ලබන මූලික ගාස්තුවක් ගෙවීමට කාඩ්පත් හිමියා එකඟ වේ. සම්බන්ධ කිරීමේ ගාස්තුව කාඩ්පත නිකුත් කරනු ලබන මොහොතේදී අය කෙරෙන අතර එය කාඩ්පත සක්‍රීය කිරීම පිළිබඳ සහතිකයක් නොවේ.

10.2 කාඩ්පත භාවිතා කිරීම සම්බන්ධයෙන් වාර්ෂික ගාස්තු ගෙවිය යුතු වන අතර, බැංකුව විසින් කාඩ්පත් හිමියා වෙත දැනුම් දෙනු ලබන ආකාරයට එම ගාස්තු කල්තබා ගෙවිය යුතු ය. වාර්ෂික ගාස්තුව බැංකුව විසින් කාඩ්පත නිකුත් කරනු ලබන මොහොතේදී අය කෙරෙන අතර එය කාඩ්පත සක්‍රිය කිරීම පිළිබඳ සහතිකයක් නොවේ.

10.3 කාඩ්පත විදේශ ලිපිනයක් වෙත කුරියර් සේවා මගින් යවනු ලැබූ විට ඒ සම්බන්ධ ගාස්තුවක් (Handling fee) කාඩ්පත් ගිණුමෙන් අයකරගැනේ.

10.4 සීමාවන් වෙනස් කිරීමේදී ඒ සඳහා අදාළ වන ගාස්තු කාඩ්පත් ගිණුමෙන් අයකරගැනේ.

10.5 ගිණුම් ප්‍රකාශ වල පිටපත් නිකුත් කිරීමේදී ඒ සඳහා අදාළ වන ගාස්තු කාඩ්පත් ගිණුමෙන් අයකරගැනේ.

10.6 කාඩ්පත් හිමියා හෝ වෙනත් පාර්ශවයක් විසින් බැංකුව වෙත ඉදිරිපත් කරන ලද චෙක්පත් හෝ වෙනත් ආකාරයේ ගෙවීම් අණකර කිසියම් හේතුවක් නිසා නොපිළිගනු ලබන්නේ නම් ඒ සඳහා බැංකුව විසින් තීරණය කරනු ලබන අනුපාතයන් යටතේ ගාස්තුවක් කාඩ්පත් ගිණුමෙන් අයකරගැනේ.

10.7 මුදල් අත්තිකාරම් ලබාගැනීම් සඳහා මුදල් අත්තිකාරම් ගාස්තුවක් සහ මෙහෙයුම් ගාස්තුවක් අයකරනු ලබන අතර එම ගාස්තු සඳහා බැංකුව විසින් තීරණය කරනු ලබන අනුපාතයන් යටතේ කාඩ්පත් ගිණුමෙන් ගාස්තු අයකරගැනේ.

10.8 බිල්පත් කාලසීමාව ඇතුළත කිසියම් අවස්ථාවකදී ණය සීමාව ඉක්මවා ගොස් තිබේ නම් සීමාව ඉක්මවා යාමේ ගාස්තුවක් අයකරනු ලැබීමට ඉඩ ඇති අතර එම ගාස්තු කාඩ්පත් ගිණුමෙන් අයකරගැනේ. මෙම ගාස්තු ගණනය කිරීමේදී කාඩ්පත භාවිතයෙන් සිදුකරන ලද, එහෙත් තවමත් කාඩ්පත් ගිණුමට බැර නොවූ ගනුදෙනු මෙන්ම කාඩ්පත් හිමියාගේ ඉල්ලීම පරිදි, ඉදිරියේදී කාඩ්පත භාවිතයෙන් සිදුකිරීම සඳහා බැංකුව විසින් තුන්වැනි පාර්ශ්වයට දෙන ලද අවසරයන් සහ ඉදිරියේදී සිදුකිරීමට නියමිත ගනුදෙනුවක් සඳහා බැංකුව විසින් කාඩ්පත් හිමියාගේ ඉල්ලීම පරිදි වෙන්කර තබාගන්නා ලද මුදල් ප්‍රමාණයන් වැනි සියල්ල සැලකිල්ලට ගැනේ.

10.9 ශ්‍රී ලංකාවේ ඉන්ධන පිරවුම්හල් වලදී පෙට්‍රල්, ඩීසල්, ගෑස් හෝ වෙනත් සැපයුම් මිලදීගැනීම සඳහා කාඩ්පත භාවිතා කිරීමේදී ඒ සම්බන්ධ සැපයුම් ගාස්තුවක් අයකරනු ලබන අතර එම ගාස්තු බැංකුව විසින් තීරණය කරනු ලබන අනුපාතයන් යටතේ කාඩ්පත් ගිණුමෙන් අයකරගැනේ.

10.10 අලෙවි/මුදල් අත්තිකාරම් ලදුපත් වල ඡායා පිටපත් ලබාගැනීම සඳහා අදාළ වන ගාස්තු, බැංකුව විසින් තීරණය කරනු ලබන අනුපාතයන් යටතේ කාඩ්පත් ගිණුමෙන් අයකරගැනේ.

10.11 කලින් කලට නියම කරනු ලබන නියාමන ගාස්තු, ඒවා අදාළ වන ආකාරයට කාඩ්පත් ගිණුමෙන් අයකරගැනේ.

10.12 කාඩ්පත් හිමියා විසින් ඉල්ලා සිටිනු ලබන ඕනෑම අතිරේක සේවාවක් සඳහා ගාස්තු පනවා, එම ගාස්තු කාඩ්පත් ගිණුමෙන් අයකර ගැනීමට බැංකුවට බලය ඇත.

10.13 භාණ්ඩ/සේවා මිලදීගැනීමක් සඳහා මුදල් ගෙවීම සහ මිලදීගැනීමක් අවලංගු කර මුදල් ආපසු ලබාගැනීම යනු එකිනෙකට වෙනස් ගනුදෙනු වර්ග දෙකකි. අතිරේක ගාස්තු අයවීම වැළැක්වීම සඳහා ගිණුම් ප්‍රකාශයේ සඳහන් වන ආකාරයට අදාළ මිලදී ගැනීම සඳහා වන ගාස්තු ගෙවීමට කාඩ්පත් හිමියා කටයුතු කළ යුතු ය. භාණ්ඩ/සේවා මිලදීගැනීමක් අවලංගු කිරීමෙන් පසුව, එම මුදල යුනියන් බැංකුව වෙත ලැබුණු පසු පමණක් (අවලංගු වීමේ ගාස්තු හැර ඉතිරි මුදල) කාඩ්පත් ගිණුමට බැර කෙරේ. අදාළ මුදල සාධාරණ කාලසීමාවක් තුළ කාඩ්පත් ගිණුමට බැරවී නොමැති නම් කාඩ්පත් හිමියා ඒ බව බැංකුව වෙත දැනුම් දිය යුතු ය.

10.14 ශ්‍රී ලංකා මුදල් හැර අනෙකුත් මුදල් වර්ග වලින් කරනු ලබන ගනුදෙනු වලට අදාළ ගාස්තු, බැංකුව විසින් තීරණය කරනු ලබන විනිමය අනුපාතයන්ට යටත්ව ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කර කාඩ්පත් ගිණුමට බැර කෙරේ. සියලු විදේශ මුදල් ගනුදෙනුවලදී පරිවර්තනය කරන ලද මුදලට, බැංකුව විසින් තීරණය කරන ලද පරිවර්තන සාධකයක් (Conversion factor) ද එකතු වනු ඇත.

10.15 ගෙවීම් පැහැර හැර ඇති හෝ අඛණ්ඩව ගෙවීම් පැහැර හැරීමේ තත්ත්වයේ පවතින කාඩ්පත් ගිණුම් වලට අදාලව දඩුවම් ගාස්තුවක් හෝ දඩුවම් පොළියක් හෝ එකතු කිරීමේ / ප්‍රතිසාධන ගාස්තුවක් අයකර ගැනීමේ අයිතිය බැංකුව සතුය. බැංකුවේ පූර්ණ අභිමතය පරිදි එම ගාස්තුව සහ එම ගාස්තු ලබාගැනීම සම්බන්ධව කටයුතු කළ හැකිය.

10.16 කාඩ්පත් ගෙවීම් බාහිර ගෙවීම් එකතු කිරීමේ ස්ථානයකදී සිදු කරන ලද අවස්ථාවකදී බාහිර ගෙවීම් එකතු කිරීමේ ස්ථානීය ගාස්තුවක් අයකර ගැනීමේ බලය බැංකුව සතුය.

10.17 කාඩ්පත් හිමියන් විසින් ATM යන්ත්‍ර, බැංකු ශාඛා, මුදල් නිකුත් කිරීමේ අලෙවිකරුවන් හෝ නියෝජිතයන් වෙතින් ලබාගන්නා මුදල් අත්තිකාරම් ATM යන්ත්‍ර, බැංකු, අලෙවිසැල්, නියෝජිත, දේශීය හා විදේශීය සීමාවන්ට යටත් වේ. තවද මහ බැංකුවේ සහ විනිමය පාලන දෙපාර්තමේන්තුවේ රෙගුලාසිද අදාළ වනු ඇත. බැංකුව විසින් නිකුත් කරන ලද රහස්‍ය අංකය භාවිතා නොකරන්නේ නම් කාඩ්පත් හිමියාට කාඩ්පත භාවිතයෙන් ATM යන්ත්‍ර වලින් මුදල් අත්තිකාරම් ලබාගැනීමට නොහැකි වේ. අලෙවි නියෝජිතයන් හෝ බැංකුවේ කවුන්ටර වෙතින් ලබාගන්නා මුදල් අත්තිකාරම් වලට, බැංකුව විසින් කලින් කලට නියම කරන ලබන උපරිම සීමාවන් අදාළ වනු ඇත.

10.18 වාරික වශයෙන් හෝ පහසු ගෙවීමේ ක්‍රම යටතේ භාණ්ඩ හෝ සේවා මිලදී ගැනීමට කාඩ්පත භාවිතා කරනු ලබන්නේ නම්, කාඩ්පත් ගිණුමේ ශේෂයට සහ කාඩ්පත් හිමියා නිසි කාලයට බැංකුව වෙත ගෙවීම් කරනු ලබන්නේය යන උපකල්පනයට යටත්ව, අදාළ ගෙවීම් වාරික වශයෙන් සිදුකිරීම සඳහා කාඩ්පත් හිමියා බැංකුව වෙත මෙයින් බලය පවරයි.

10.19 බැංකුව විසින් කලින් කලට පිරිනමනු ලබන ගාස්තු අඩුකිරීම් හෝ කපාහැරීම්, බැංකුවේ අභිමතය පරිදි අවශ්‍ය ඕනෑම මොහොතක ඉවත් කිරීමේ හෝ සීමා කිරීමේ බලය බැංකුව සතු ය. බැංකුව විසින් කාඩ්පතේ ස්වභාවය සහ අදාළ අවස්ථාව අනුව තම අභිමතය පරිදි ඇතැම් ගාස්තු ඉවත් කිරීමට ඉඩ ඇත.

10.20 මූල්‍ය ගාස්තු, කාඩ්පතට අදාළ ගාස්තු හා අයකිරීම් මෙන්ම කාඩ්පත භාවිතා කිරීම සම්බන්ධ ගාස්තු බැංකුව විසින් ප්‍රකාශයට පත්කර ඇති ගාස්තු මාලාවේ දැක්වෙන අතර, දිවයින පුරා පිහිටි යුනියන් බැංකු ශාඛා වලින් එම ගාස්තු මාලාව ලබාගත හැකි වේ. සියලුම ගාස්තු, අයකිරීම්, පොලී අනුපාත, දඩ මුදල් සහ ආන්තිකයන් බැංකුවේ අභිමතය පරිදි පූර්ව දැනුම්දීමකින් තොරව වෙනස් විය හැකි අතර එබඳු සංශෝධනයන් සහ එක්කිරීම් ගිණුම් ප්‍රකාශය සමග එවනු ලබන දැනුම්දීමක් ලෙස, ශ්‍රී ලංකාවේ පුවත්පතක හෝ පුවත්පත් වල පළකරනු ලබන දැන්වීමක් ලෙස, බැංකුවේ/බැංකු ශාඛා වල දැන්වීම් පුවරු වල සඳහන් කරනු ලබන නිවේදනයක් ලෙස හෝ බැංකුවේ වෙබ් අඩවියේ යාවත්කාලීන කිරීමක් ලෙස කාඩ්පත් හිමියා වෙත දැනුම්දීමට බැංකුව කටයුතු කරනු ඇත.

## 11. ගිණුම් ප්‍රකාශ, ගෙවීම් සහ ගෙවීම් පැහැර හැරීමේ ප්‍රතිඵල

11.1 කාඩ්පත් ගිණුමට අනුව ගෙවීමට ඇති මුළු මුදල සම්බන්ධ විස්තර සඳහන් වන ගිණුම් ප්‍රකාශයක්, සෑම බිල්පත් කාලසීමාවක් අවසානයේදී මූලික කාඩ්පත් හිමියා වෙත යවනු ලබන අතර

එම ගිණුම් ප්‍රකාශය පිළියෙල කළ දිනය අනුව ගෙවීමට ඇති අවම මුදල, එහි සඳහන් දිනයට පෙර කාඩ්පත් හිමියා විසින් ගෙවනු ලැබිය යුතු ය.

11.2 ගෙවීමට ඇති මුළු මුදලෙන් කිසියම් ප්‍රතිශතයක් හෝ පොදු අවම මුදලක් යන දෙකෙන් ඉහළ අගය ලෙස බැංකුව විසින් කලින් කලට ගෙවිය යුතු අවම මුදල තීරණය කරනු ලබයි. ගෙවිය යුතු මුළු මුදල පොදු අවම මුදලට වඩා අඩු අගයක් ගන්නේ නම් ගෙවිය යුතු මුළු මුදල සහ ගෙවිය යුතු අවම මුදල සමාන වේ.

11.3 සියලු ගිණුම් ප්‍රකාශ කාඩ්පත් හිමියා විසින් බැංකුවට අවසන් වරට ලිඛිතව දන්වා ඇති ලිපිනයට හෝ කාඩ්පත් හිමියාගේ ඉල්ලීම පරිදි විද්‍යුත් ලිපිනයකට යොමුකරනු ලබයි. තැපැල් මගින් යවා පැය 48 ක් ඇතුළත සහ විද්‍යුත් තැපැල් මගින් යැවීමේදී බැංකුවේ විද්‍යුත් තැපැල් සර්වර් වලින් අදාළ ලිපිය නිකුත් වූ පසුව අදාළ ගිණුම් ප්‍රකාශය කාඩ්පත් හිමියා වෙත ලැබුණු ලෙස සැලකේ. ගිණුම් ප්‍රකාශය නොලැබීම යනු ගෙවීම් නොකර සිටීම සඳහා සාධාරණ හේතුවක් ලෙස පිළිගනු නොලැබේ.

11.4 විද්‍යුත් තැපැල් මගින් ගිණුම් ප්‍රකාශ ලබාගැනීමේ ක්‍රමය තෝරාගත් කාඩ්පත් හිමියන්ට මුද්‍රිත ගිණුම් ප්‍රකාශ යොමුකිරීමක් සිදු නොකෙරේ. එබඳු කාඩ්පත් හිමියෙකුට මුද්‍රිත ගිණුම් ප්‍රකාශයක්/සහතික කළ ගිණුම් ප්‍රකාශයක් අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතු අතර ඊට සේවා ගාස්තුවක්ද අයවනු ඇත.

11.5 අදාළ කාලසීමාව තුළ ගනුදෙනු සිදුවී නොමැති නම් කාඩ්පත් හිමියා වෙත ගිණුම් ප්‍රකාශයක් යැවීම සිදු නොවන අතර ගෙවිය යුතු අවම මුදල ලෙස ගිණුම් ප්‍රකාශයෙහි බින්දුව හෝ ණය ශේෂයක් සටහන් වනු ඇත.

11.6 ගෙවීම් කළ යුතු දිනය ලෙස සඳහන් දිනය වනවිට කාඩ්පත් හිමියා ගෙවිය යුතු අවම මුදල/මුළු මුදල ගෙවීමට අපොහොසත් වන්නේ නම්, බැංකුව විසින් තීරණය කරනු ලබන අනුපාතයකට අනුව පමා වී ලැබෙන ගෙවීම් සඳහා වන ගාස්තුවක් කාඩ්පත් ගිණුමෙන් අයකෙරේ. ගෙවීම් කළ යුතු දිනය ලෙස සඳහන් දිනය වනවිට ගෙවීම් නොකිරීම මගින් කාඩ්පත් පහසුකම (තාවකාලිකව හෝ සදාකාලිකව/අර්ධ වශයෙන් හෝ පූර්ණ වශයෙන්) අවලංගු වීමට ඉඩ ඇත. එමගින් මූලික කාඩ්පත සහ අතිරේක කාඩ්පත් භාවිතා කිරීමට නොහැකි වීම මෙන්ම ණය තොරතුරු කාර්යාංශය සහ/හෝ වෙනත් නියාමන වාර්තාකරණ අංශ වෙත එම තත්ත්වය වාර්තා වීමටද ඉඩ ඇති අතර එමගින් කාඩ්පත් හිමියා අනෙකුත් බැංකු සහ මූල්‍ය ආයතන සමග දැනට පවත්වාගෙන යන සහ ඉදිරියේදී පවත්වා ගැනීමට අපේක්ෂා කරන මූල්‍ය සම්බන්ධතා වලටද බලපෑම් එල්ල වීමට ඉඩ තිබේ.

11.7 කාඩ්පත වලංගු කාලසීමාව තුළ ඕනෑම අවස්ථාවකදී තම අභිමතය පරිදි, ගෙවිය යුතු සම්පූර්ණ මුදල පියවන ලෙස කාඩ්පත් හිමියාගෙන් ඉල්ලා සිටීමට බැංකුවට පූර්ණ අයිතිය ඇත.

11.8 කාඩ් ගිණුමට අදාළව කාඩ්හිමියා විසින් බැංකුව වෙත සිදුකරනු ලබන ගෙවීම් බැංකුව විසින් තීරණය කරන ලද නියෝගයක් පරිදි බැංකුවට ඇති ණය වගකීම් පියවීම් ලෙස බැංකුව විසින් අදාළ කරගනු ලබයි. නියමිත දිනට කාඩ්හිමියා විසින් ගෙවීමට ඇති මුදල් ගෙවීම සිදු නොකරයි නම් ගනුදෙනු සඳහා ගාස්තුවක් අය කෙරෙනු ලබන අතර ගනුදෙනුව/ අයකිරීම් කරන ලද දිනයේ සිට ඇරඹෙන දෛනික ශේෂය මත ගාස්තු ගණනය කිරීම සිදු කළ හැක. බිල් කිරීමේ කාලසීමාව තුළ අදාළ ගාස්තු තීරණය කිරීම බැංකුව සතුය.

11.9 මෙම ගිවිසුම යටතේ ගෙවිය යුතු සියලුම මුදල් ශ්‍රී ලංකා රුපියල්වලින් ගෙවිය යුතු වේ. ශ්‍රී ලංකා රුපියල් නොවන වෙනත් මුදල් වර්ගයකින් ගෙවීම ලද නම් ගෙවීම ප්‍රතික්ෂේප කිරීම හෝ පවතින අනුපාතයන් යටතේ එම මුදල් ශ්‍රී ලංකා රුපියල් අගයට හැරවීමේ අභිමතය බැංකුව සතුවේ. කාඩ්හිමියා/ හිමියන් විනිමය අනුපාත අවදානම්, අගය පහළ යාම්, කොමිස්, ගාස්තු සහ අයකිරීම් පිළිබඳ සියලු අවදානම් පිළිබඳව වගකීම භාරගත යුතුය.

11.10

සහ කාඩ් හිමියා විසින් ඉක්මනින් අදාළ ගෙවීම් සිදු නොකරන අවස්ථාවක බැංකුව වෙත ගෙවීම ලැබුණු පසු සහ එම මුදල් කාඩ් ගිණුමට බැරවීමෙන් පසු පමණක් ගනුදෙනුව සිදුකරනු ලබයි. ඕනෑම මුදල් තැන්පතුවක් ලැබුනේ යැයි බැංකුව විසින් සලකනු ලබන්නේ එය කාඩ් ගිණුමට බැරවීමෙන් පසුවය.

11.11

චෙක් පතක් නිෂ්කාශනය වී කාඩ් ගිණුමට බැරවන තුරු අදාල චෙක් තැන්පතුව ගෙවීමක් ලෙස නොසැලකේ.

11.12

කාඩ් හිමියාට සිය ජංගම හෝ ඉතිරි කිරීමේ ගිණුමට (නම්කරන ලද පියවීමේ ගිණුම) සෘජු බැර ස්ථාවර උපදේශන නිකුත් කළ හැකි අතර නියමිත දිනට යුනියන් බැංකුවේ කාඩ් ගිණුමට ගෙවීමට ඇති ක්‍රෙඩිට් කාඩ් බිල් අගයෙන් ප්‍රතිශතයක් බැර කිරීමට හැකිය. ඊළඟ ගෙවීමේ දිනයට අවම වශයෙන් සති දෙකකට පෙරාතුව එවැනි ඕනෑම ස්ථාවර උපදේශයක වෙනස්කමක් හෝ අවලංගු කිරීමක් සඳහා කාඩ් හිමියා එකඟවේ. නම්කරන ලද ගිණුමක් සඳහා ලබා දී ඇති එවැනි ඕනෑම සෘජු බැර ස්ථාවර උපදේශයක් සඳහා පහත සඳහන් අමතර නියම සහ කොන්දේසි අදාළ වේ.

i. ඉදිරිපත් කළ චෙක්පතක් හෝ වෙනත් ඕනෑම විධිවිධානයක් සම්බන්ධ ඕනෑම ස්ථාවර උපදේශයක ප්‍රමුඛතාවය පිළිබඳව තීරණය කිරීමේ හිමිකම බැංකුව සතු බවට කාඩ්හිමියා එකඟ විය යුතුය.

ii. ගෙවීම් සිදු කළ යුතු දිනට පෙරාතුව ස්ථාවර නියෝග සම්පූර්ණ කිරීම සඳහා කාඩ්හිමියා විසින් නිර්දේශිත පියවීමේ ගිණුම වෙත ප්‍රමාණවත් අරමුදල් සැපයීමට එකඟ විය යුතුය. පියවීමේ ගිණුමේ ප්‍රමාණවත් මුදලක් නොමැති නම්, බැංකුවේ අභිමතය පරිදි කලින් කලට බැංකු අයිරා පිරිනමමින් ස්ථාවර උපදේශ අනුව මුදල් ප්‍රමාණය අයකර ගැනීමට හැකියාව ඇත. කාලයෙන් කාලයට බැංකුව විසින් තීරණය කරනු ලබන ගාස්තුවලට යටත්ව අදාළ සෑම ගෙවීමක්ම සිදුකිරීමට කාඩ්හිමියා බැඳී සිටී.

iii. ස්ථාවර උපදේශ ගනුදෙනුවක් ක්‍රියාවට නැංවීමට බැංකුවට එක්වරක් පමණක් උත්සාහ කළ හැකි අතර අවස්ථා කිහිපයකදී එසේ කිරීමට බැංකුව බැඳී නොසිටින බවට කාඩ්හිමියා එකඟ වේ.

iv. ප්‍රකාශන දිනය සහ සත්‍ය ගෙවීම් දිනය අතර සිදුකරන අන්තර්කාලීන ගෙවීම්, නිර්දේශිත පියවීම් ගිණුමට සිදුකළ සෘජු බැර ස්ථාවර උපදේශන යටතේ ගණනය කිරීමේදී නොසැලකෙන බවට කාඩ්හිමියා එකඟ වේ.

v. ස්ථාවර නියෝග උපදෙස් ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් මුදල් නිර්දේශිත පියවීමේ ගිණුමෙහි නොමැති වූයේ නම්, බැංකුව විසින් කොටස් ගෙවීමක් හෝ නැවත අයකර ගැනීමක් සිදු කළද ඒ සඳහා සේවා ගාස්තුවක් අයකරනු ඇත. ප්‍රකාශිත ගාස්තුව බැංකුව විසින් තීරණය කරනු ලබන කාලයෙන් කාලයට වෙනස් වීම සිදු විය හැක.

vi. ස්ථාවර නියෝග උපදේශයන්හි සඳහන් මුළු මුදල් ප්‍රමාණය ගෙවීම සඳහා පියවීමේ ගිණුමෙහි ප්‍රමාණවත් ශේෂයක් නැති නම්, බැංකුව ගිණුමෙහි ඇති මුදල් ලබා ගනු ඇත. නියමිත පියවීමේ කාලසීමාව තුළ ගෙවන ලද ප්‍රමාණවත් මුදල් නොමැති නම් කාඩ්පත් ගිණුමට මූල්‍ය ගාස්තුවක් සහ පසුව ගෙවීමේ ගාස්තුවක් අයකරනු ඇත.

11.13 කාඩ්පත් හිමියාගේ කාඩ් බිල් ගෙවීම සඳහා කලින් කල එකතු කර ගනු ලබන තෙවැනි පාර්ශව ජාලයන් හෝ වෙනත් ඕනෑම පාර්ශවකාර අලෙවිසැල් වෙතින් සිදුකරනු ලබන ගෙවීම් කාඩ්පත් හිමියාගේ ගිණුමට බැර වීමේ ප්‍රමාදයන් සම්බන්ධයෙන් බැංකුව වගකිව යුතු නොවේ. බැංකුව විසින් එවැනි ප්‍රමාද ගෙවීම් සඳහා ගාස්තුවක් අය කළ හැකි අතර, එම ගාස්තු නිර්ණය කිරීමේ අභිමතය බැංකුව සතුවේ. එවැනි තෙවැනි පාර්ශව ගෙවීම් සියල්ලම හැසිරවීම් ගාස්තුවකට යත් වන අතර, බැංකුව විසින් තීරණය කරනු ලබන ගාස්තුවකට යටත්ව ඒවා කාඩ්පත් ගිණුමට බැරවේ.

12 අන්තර්ජාල බැංකු සේවාව (Online Banking) සහ ජංගම දුරකථන බැංකුකරණ සේවාව (Mobile Banking)

කාඩ්පත් හිමියා යුනියන් බැංකුවේ අන්තර්ජාල බැංකුකරණ පහසුකම හෝ ජංගම දුරකථන බැංකුකරණ පහසුකම ලබා ගෙන තිබේ නම් හෝ අනාගතයේදී ලබා ගැනීමට අපේක්ෂා කරන්නේ නම් ඔහු/ ඇය තම ක්‍රෙඩිට් කාඩ් තොරතුරු වෙත ප්‍රවේශවීම සහ එම පහසුකමට අදාළ වෙනත් ක්‍රියාකාරකම් සඳහා එකඟ විය යුතු අතර ඒ පිළිබඳව අවබෝධයෙන් පසුවිය යුතුයි. ඉහත සඳහන් පහසුකම් භාවිතා කිරීමේදී බැංකුව විසින් ඒ පිළිබඳව පනවා තිබෙන නියම සහ කොන්දේසි පිළිපැදීමට කාඩ්පත් හිමියා බැඳී සිටිය යුතුයි.

13. ගැටළුකාරීත්වයන්

13.1 ඕනෑම ගාස්තුවක් හෝ ගෙවීම් සිදුකිරීම සඳහා බැංකුව විසින් පත්කරන ලද වෙළෙඳ නියෝජිතයෙකු වෙතින් ලැබෙන ගෙවීම් අධිග්‍රහණයක් එම මුදල ලද බවට නිසැක සාක්ෂියක් වන අතර 14 වැනි වගන්තිය ප්‍රකාරව කාඩ්පත අස්ථානගතවීම, සොරකම් කිරීම පිළිබඳව නිවැරදිව බැංකුවට දැනුම් දිය යුතුය. කාඩ්පත වංචාසහගත ලෙස භාවිතා කර තිබේ නම් එහි වගකීම කාඩ්හිමියා සතුය. හෝටල් ගාස්තු වැනි විවිධ ගාස්තු සඳහා කාඩ්පතින් ගෙවීමේදී ගාස්තු අයකිරීමක් සිදු නොවන අතර වෙළෙඳ නියෝජිත ආයතනයකදී සිදුකරන ගෙවීම් සඳහා නිසැකවම කාඩ්පත් හිමියා අදාළ අයකිරීම් පියවිය යුතුය. එවැනි ගෙවීම් තුණ්ඩුවෙහි කාඩ්හිමියාගේ අත්සන සහ කාඩ් අංකය සඳහන් කළ යුතු අතර, එය බැංකුව සහ කාඩ්හිමියා අතර නිශ්චිත සාක්ෂියක් ලෙස සැලකේ. කාඩ්හිමියා විසින් මිලදී ගැනීමට නියමිත/ මිලදී ගත් භාණ්ඩ හෝ සේවාව තෘප්තිමත් විය හැකි ආකාරයට ලද බවට බැංකු සහතික කිරීමක් අවශ්‍ය නොවේ.

13.2 මූලික කාඩ්පත සහ අතිරේක කාඩ්පත (පත්) භාවිතා කරමින් සිදුකරන සියලු ගනුදෙනු පිළිබඳව කාලීන ප්‍රකාශන සහ/ හෝ එස්එම්එස් පණිවිඩ ඔස්සේ කාඩ්පත් හිමියා දැනුවත් වී සිටිය යුතුය. එස්එම්එස් පණිවිඩයක් මගින් දැනුවත් කෙරෙන ගනුදෙනුවක් පිළිබඳව කාඩ්හිමියා එකඟ නොවේ නම් වහාම පැය 24 ඇතුලත බැංකුව දැනුවත් කළ යුතුය. ප්‍රකාශනයෙහි දැක්වෙන අයකිරීම පිළිබඳව කාඩ්පත් හිමියා එකඟ නොවන අවස්ථාවක ප්‍රකාශනය ලැබී දින 20ක් ඇතුලත බැංකුව දැනුවත් කිරීමට කටයුතු කළ යුතුය. එසේ කිරීමට අසමත්වන අවස්ථාවකදී ඊට අදාළ සියලු ගාස්තු අයකර ගැනීම සිදුවනු ඇත. මෙම ප්‍රකාශනයන්හි සඳහන් අයකිරීම් නිසා අගතියට පත් පාර්ශවය විසින් සිදුකරන දැනුම් දීමෙන් පසුව බැංකුව විසින් එම ගැටළුව නිරාකරණය කිරීම සඳහා වඩාත් සාධාරණ ආකාරයට කටයුතු කළ යුතුය. එවැනි ක්‍රියාවලියකින් පසුව අදාළ සිදුවීමෙහි ප්‍රකාශනයෙහි සඳහන් කරුණු නිරවද්‍ය යැයි බැංකුව නිශ්චය කරයි නම් කාඩ්පත් හිමියාට අදාළ තොරතුරු සහිතව අදාළ ගෙවීම් ස්ලිප් පතෙහි පිටපතක් සමග දැනුම් දිය යුතුය. ඉන් පසුව කාඩ්පත් හිමියා විරෝධයකින්

තොරව අදාළ පොලිය සහ වෙනත් ඕනෑම ගාස්තුවක් සමග ගෙවීම සිදු කළ යුතු අතර එම මුදල් නැවත අයකර ගැනීමට බැංකුව සුදුසුකම් ලබයි.

13.3 මතභේදාත්මක ගනුදෙනු නිසා ඇතිවන ප්‍රතිවර්තනයන් හෝ නැවත මුදල් ලබා ගැනීම ඇතුළුව ගනුදෙනුව අවලංගු කිරීම, ප්‍රතිවර්තනය හෝ නැවත මුදල් ලබා ගැනීම යන අවස්ථාවකදී සිදුවන ඕනෑම විනිමය පාඩුවක් සඳහා කාඩ්පත් හිමියා විසින් වගකීම භාරගත යුතුය.

14. අස්ථානගත වීම! කාඩ්පත සොරකම් කිරීම

14.1 කාඩ්පත අස්ථානගත වීම හෝ සොරකම් කිරීමක් පිළිබඳව වහාම කාඩ්පත් හිමියා බැංකුවේ කාඩ් මධ්‍යස්ථානය දැනුවත් කළ යුතුය. කාඩ්පත් හිමියා විසින් මේ පිළිබඳව පොලීසිය/ නීතිය ක්‍රියාත්මක කිරීමට බැඳී සිටින ආයතනයන් වෙත පැමිණිලි ගොනු කළ යුතුය. බැංකුවේ කාඩ් මධ්‍යස්ථානය විසින් කාඩ්පත අස්ථානගතවීම/ සොරකම් කිරීම දැනුවත් වීම සිදු වන තුරු සිදු වන ගනුදෙනු සඳහා අදාළ ගාස්තු ගෙවීමට කාඩ්හිමියා බැඳී සිටී. දුරකථන මගින් මේ පිළිබඳව දැනුම් දීමට කාඩ්හිමියාට හැකියාව තිබෙන අතර, ඒ පිළිබඳව සහතික කළ දිවුරුම් ප්‍රකාශයක් හිමිකම් අත්හැරීම ස්ථිර කරමින් ලබා දිය යුතුය. පොලීසිය/ නීතිය ක්‍රියාවට නංවන ආයතනයක සිදු කළ පැමිණිල්ලේ පිටපතක් අත්සන් සහිතව ලබා දිය යුතුය. කාඩ්පත අස්ථානගතවීම/ සොරකම් කිරීම ස්ථිර කරගනිමින් හෝ නොකරමින් තාවකාලිකව කාඩ් ගිණුම අත්හිටුවීමට බැංකුවට හැකියාව තිබෙන අතර එම ගිණුම පිළිබඳව උද්ගතවිය හැකි කිසිදු අපහසුතාවයක් පිළිබඳව වගකීමක් බැංකුව සතු නොවන බවද දැන සිටිය යුතුය.

14.2 බැංකුවේ කාඩ් මධ්‍යස්ථානය වෙත කාඩ්පත අස්ථානගතවීම/ සොරකම් කිරීම පිළිබඳව නිසි ආකාරයකට දැනුම් දෙන තුරු අනවසර භාවිතාවන් හරහා කාඩ් ගිණුමට බැරවන මුදල් සහ ගිණුමට බැර කිරීමට නියමිත මුදල් පිළිබඳව වගකීම කාඩ්හිමියා විසින් දැරිය යුතුවේ.

14.3 කාඩ්පත අස්ථානගතවීමක්, සොරකම් කිරීමක්, පළුදුවීමක් සිදුවූ පසු කාඩ්පත නැවත හමු වුවද එය නැවත භාවිතා නොකළ යුතු අතර එයින් සිදුවන ගනුදෙනු අගරු ගනුදෙනු ලෙස සැලකේ. කාඩ්පත අස්ථානගතවීමක්, සොරකම් කිරීමක්, පළුදුවීමක් සිදුවී එය දැනුම් දුන් පසු කාඩ්පත නැවත හමු වුවද එම කාඩ්පත අවලංගු කිරීමට කාඩ්හිමියා වගකීමෙන් බැඳී සිටී. කාඩ්පතෙහි ආරක්ෂාව පිළිබඳව කාඩ්හිමියා සෑම විටම වගකීමෙන් බැඳී සිටින අතර එය සුරැකීමට ගත හැකි සෑම පියවරක්ම අනුගමනය කළ යුතුය. පෙර කී පියවරයන් සැකසහිත බව බැංකුව තීරණය කරන අවස්ථාවක කාඩ්පත අවලංගු කිරීමක් සිදුවිය හැක.

14.4 යුනියන් බැංකුව විසින් වංචනික භාවිතා අවදානමක් පිළිබඳව දැනුම්දී තිබියදීත් ප්‍රවේශය සඳහා අවසර ඉල්ලා සිටින අවස්ථාවක ඊට අදාළව වාර්තාවන කිසිදු වංචනික ගනුදෙනුවක් හෝ භාවිතාවක් පිළිබඳව යුනියන් බැංකුවට වගකීමක් නොමැත.

14.5 කාඩ්පත අස්ථානගත වීමක්, සොරකම් කිරීමක් හෝ අයථා භාවිතාවක් අවස්ථාවකදී කාඩ්හිමියා භාරයේ පවතින සෑම තොරතුරකම භාරකාරීත්වය බැංකුව වෙත භාර දිය යුතු අතර ඊට අදාළව බැංකුව ගනු ලබන සෑම ක්‍රියාමාර්ගයකදීම කාඩ්පත නැවත ලබා ගැනීම සඳහා බැංකුවට සහයෝගය ලබා දිය යුතුය.

14.6 කාඩ්පත් අස්ථානගත වීමකදී වෙළෙඳ නියෝජිත ජාලය වෙත ඒ බව දැනුවත් කිරීම සඳහා වැය වන පරිපාලන වැය අයකරගැනීම සඳහා බැංකුව විසින් ගාස්තුවක් අය කිරීමට හැක.

14.7 අස්ථානගතවීම හෝ සොරකම් කිරීම යන කරුණු මත නැවත කාඩ්පතක් නිකුත් කිරීම සඳහා බැංකුව බැඳී නොසිටී. එසේ නැවත කාඩ්පතක් නිකුත් කිරීමේදී ඒ සඳහා හැසිරවීම් ගාස්තුවක් අයකරන අතර එය කාඩ්පත් ගිණුමට බැර වේ. ඒ සඳහා ගාස්තු බැංකුවේ අභිමතය මත තීරණය කරනු ලබයි. ඒ සඳහා පෙර කාඩ්පතට අදාළ වූ නියම සහ කොන්දේසි බලපවත්වනු ඇත.

14.8 කාඩ්පත් හිමියා විසින් කාඩ්පතෙහි PIN අංකය සහ කාඩ්පත සහතික කිරීමේ අංකය ඇතුළු සියලුම රහසිගත තොරතුරු ආරක්ෂා කළ යුතු අතර ඒවා වෙනත් කිසිවෙකුගේ දැනගැනීම සඳහා විවෘත වීමට ඉඩ නොතැබිය යුතුයි. PIN අංකය හෝ කාඩ්පත සහතික කිරීමේ අංකය අස්ථානගත වීමකදී, සොරකම් කිරීමකදී හෝ වෙනත් පාර්ශවයක් විසින් දැනගැනීමකදී, 14 (1) වගන්තියෙහි සඳහන් පරිදි ඒ පිළිබඳව ඉක්මනින්ම බැංකුව දැනුවත් කිරීමට කාඩ්පත් හිමියා කටයුතු කළ යුතුය.

## 15. රක්ෂණ ආරක්ෂාව

බැංකුව සිය අභිමතය පරිදි කාලයෙන් කාලයට රක්ෂණ නිපැයුම් කාඩ්පත් හිමියාට ලබා දීමට කටයුතු කරයි. එවැනි රක්ෂණ ඔප්පුවකට අදාළව වන්දි ගෙවීම සඳහා අදාළ සම්පූර්ණ වගකීම රක්ෂණ සමාගම දරන බව කාඩ්පත් හිමියා දැනගත යුතු අතර ඊට අදාළ වන්දි පූර්ණය කිරීම් හෝ වෙනත් කිසිදු ක්‍රියාවලියක් සඳහා බැංකුව වගකිව යුතු නොවන බවද අවබෝධ කරගත යුතුය. කාඩ්පත් හිමියාට / හිමියන්ට කිසිදු පූර්ණ දැනුම් දීමක් නොමැතිව ඕනෑම අවස්ථාවක මෙම රක්ෂණ හිමිකම සහ එහි ප්‍රතිලාභයන් ඉවත් කිරීමට බැංකුවට හැකියාව තිබේ. එවැනි රක්ෂණ හිමිකම් සඳහා රක්ෂණ සමාගමට සහ බැංකුවට වෙන වෙනම කොන්දේසි සහ නියමයන් තීරණය කිරීමට හැකියාව තිබේ.

## 16. එස්එම්එස් ඇලර්ට් සේවාව භාවිතා කිරීම

16.1 කාඩ්පත් ගනුදෙනු, කාඩ්පත් ආශ්‍රිත ක්‍රියාකාරකම් සහ ගෙවීම් සිහිකැඳවීම් ආදියට අදාළව බැංකුව විසින් කලින් කලට එස්එම්එස් ඇලර්ට් එවීමට හැකියාව තිබේ. කීර්තිනාම හානිය, මානසික ආතතිය සහ තොරතුරු හෙළිකිරීම් වැනි කරුණු ඇතුලත් විය හැකි එස්එම්එස් ඇලර්ට් මගින් සිදුවිය හැකි හානීන් සඳහා බැංකුවේ වගකීමක් නොමැත.

16.2 ශ්‍රී ලංකාව තුළ පවතින විදුලි සංදේශ යටිතල පහසුකම්, සබඳතා සහ සේවා තත්ත්වය මත මෙම පහසුකම පදනම්වන බව පාරිභෝගිකයා අවබෝධ කරගත යුතුය. බැංකුව විසින් එවනු ලබන එස්එම්එස් ඇලර්ට්වලට අදාළ දින වකවානු එම අවස්ථාවෙහි විදුලි සංදේශ කර්මාන්තයෙහි පවතින කරුණු අනුව තීරණය විය හැක. බැංකුව හෝ එහි සේවා සපයන්නන් ඇලර්ට් නොලැබීම, ප්‍රමාද වීම, වැරදි, පාඩුවීම්, සම්ප්‍රේෂණ විකෘති වීම් සහ වැරදි ඇලර්ට් ලැබීම පිළිබඳව වගකීමක් ගනු නොලබයි.

ඇතැම් රටවල් මෙම සේවාව භාවිතා නොකරන අතර එම රටවල්වල නියාමන අවශ්‍යතා සහ බාධාවන් ඊට හේතු වී තිබේ.

16.3 ගණුදෙනුකරුගේ හිමිකම් පිළිබඳ කිසිදු අයිතිවාසිකමක් නොතිබීමකින් තොරව, කිසියම් හේතුවක් නිසා එම නියමයන් හා කොන්දේසි උල්ලංඝනය වීමකදී පෙර දැනුම් දීමක් නොමැතිව සහ හේතු දැක්වීමකින් තොරව ඕනෑම අවස්ථාවක සේවාව සඳහා අයකරන ගාස්තු වෙනස් කිරීම, සේවාව තාවකාලික අත්හිටුවීම සහ/ හෝ ස්ථිරව අවසන් කිරීම සේවාව වෙනස් කිරීම පිළිබඳ පූර්ණ අභිමතය බැංකුව සතුවන අතර,

17. දුරකථන, අන්තර්ජාල, ටෙලෙක්ස්, ෆැක්සිමයිල් සහ ඊමේල් උපදෙස්

17.1 කලින් කල සිදුකරන ඕනෑම දැනුම් දීමක්, උපදේශයක්, ඉල්ලීමක් හෝ වෙනත් සන්නිවේදනයක් අනුව ක්‍රියාත්මක වීමට කාඩ් හිමියා විසින් බැංකුවට බලය පවරනු ලබන අතර, දුරකථන, අන්තර්ජාලය, ටෙලෙක්ස්, ෆැක්සිමයිල්, හෝ ඊමේල් මගින් අභිප්‍රාය දැන්වීමට කාඩ්හිමියා/ ඔහු හෝ ඇය වෙනුවෙන් පත්කරන තැනැත්තා කටයුතු කරනු ඇත. උපදෙස් ලැබෙන අවස්ථාවේ පවතින තත්ත්වයන් අනුව කිසියම් අගතියකට පත්වීමකින් තොරව අදාළ අනන්‍යතාවය මත කටයුතු කළ යුතුය. උපදෙස් ලැබෙන අවස්ථාවේ පවතින බැංකුවේ රීතීන් අනුව කටයුතු කිරීමට කාඩ් හිමියා කටයුතු කළ යුතුය.

17.2 කාඩ්පත් හිමියා විසින් බලය පවරා ඇති ලෙසට උපදෙස් අනුගමනය කිරීමට බැංකුවට අභිමතය ඇති අතර, එම උපදෙස් අනුව සුදුසු ක්‍රියාමාර්ගයකට එළඹීමේ හැකියාව බැංකුව සතුය. අදාළ උපදෙස් අනුව ඕනෑම ගිණුමකට මුදල් හර හෝ බැර කිරීමට හෝ මුදල් හෝ ලේඛනයක් පවරා දීම සම්බන්ධයෙන්, බැංකුව සමග හෝ වෙනත් පාර්ශවයක් සමග ගිවිසුම්ගතවීමකට උපදෙස් දීම හෝ වෙනත් ඕනෑම සම්මුතියක් සඳහා ගනුදෙනුවේ හෝ සම්මුතයෙහි ස්වභාවය නොසලකා හැර උපදෙස් අනුව අපැහැදිලිතාවයක් හෝ අනවබෝධයක්, වරදක්, ඒකාග්‍රතාවෙයක් නොමැතිකමක් තිබියදීත් එම මුදල් ප්‍රමාණය පිළිබඳව අදාළ තීරණ ගැනීම බැංකුවේ අභිමතය අනුව සිදුවේ.

17.3 මෙම බලය පවරාදීමේ නියමයන් සමග ඊට අනුකූලව බැංකුව කටයුතු කරන ආකාරය පිළිබඳව සැලකීමේදී කාඩ්පත්හිමියා විසින් කිසියම් අවලංගු කිරීමක් සිදුකර නොමැති විට වන්දි ගෙවීමට සිදු විය හැක. බැංකුව පාර්ශවයෙන් උපදෙස් අනුව හෝ ඊට පටහැනිව කිසියම් හෝ ස්වභාවයකින් සිදුවිය හැකි කිසියම් පාඩුවක්, වන්දි, ක්‍රියාමාර්ග, ක්‍රියාවලීන්, ඉල්ලීම්, හානීන්, වියදම් වැනි දෑ ඊට අයත් වේ.

17.4 මෙම බලාත්මක නියමයන් සහ වන්දිගෙවීම් පිළිබඳ පූර්ණ අනුමැතිය බැංකුව ලබන තුරු සහ ඒ සඳහා ප්‍රමාණවත් කාලයක් ලබා දෙන අතර අත්හිටුවන ලෙස දන්වා කාඩ්පත් හිමියා විසින් සිදුකරනු ලබන දැනුම් දීම, කිසිදු වගකීමකින් මිදීම සඳහා කාඩ්පත් හිමියාට ලැබෙන අවස්ථාවක් නොවන

අතර මෙම නියම සමග අදාළව වන්දි ගෙවීම සහ මෙම බලාත්මක නියමයන්ට අනුකූලව එම කාලසීමාවට පෙර ඕනෑම වන්දි ගෙවීමක් සිදුකරනු ඇත.

18 එකතුකිරීම්

කාඩ්හිමියාගේ මුදල් අයකර ගැනීම සඳහා එක් අයෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් පත්කිරීම, කාඩ්හිමියා විසින් සපයන ඕනෑම සුරැකුමක් බලාත්මක කිරීම, කාඩ්පත් හිමියාගේ මුදල් පිළිබඳ පූර්ණ අවදානම යුනියන් බැංකුව යටතේ පවතී. කාඩ්හිමියාට අයත් එවැනි තොරතුරක්, කරුණක්, සංඛ්‍යාලේඛනයක්, සුරැකුමක් පිළිබඳ තොරතුරු සැපයීම යුනියන් බැංකුව සුදුසු යැයි සිතන ආකාරයට සිදු කළ හැක. යුනියන් බැංකුවට ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා යුනියන් බැංකුව සුදුසු යැයි සිතන ආකාරයට තැනැත්තෙකු/ තැනැත්තන් පත්කිරීමේ බලය ඇත.

ඕනෑම කාඩ්හිමියෙකුගෙන් අයවීමට ඇති මුදල බලයලත් එකතු කිරීමේ නියෝජිතායතනයට ලබා ගැනීම සඳහා බැංකුවට අභිමතය පවතින අතර ඊට වැය වන මුදල සඳහා ගාස්තුවක් කාඩ්පත් හිමියාගේ ගිණුමින් අයකරගැනීමට බැංකුවට හැකියාව ලැබේ.

19. බේරුම්කරණය

කාඩ්පත්හිමියා යුනියන් බැංකුව සහ එම සමූහයේ වෙනත් සමාගමක් සමග වර්තමානයේදී හෝ අනාගතයේදී පවත්වා ගෙන යනු ලබන ඕනෑම වර්ගයක තැන්පතුවක් (ස්ථාවර තැන්පතු ඇතුළුව) රඳවා ගැනීම සහ අත්හැරීම පිළිබඳ පරම අයිතිය යුනියන් බැංකුව සහ එම සමූහයේ සමාගම් වෙත පවතී. යුනියන් බැංකුව සහ / හෝ එහි සමූහ සමාගම් විසින් පාලනය කරන ලද හෝ තනි නාමයක් හෝ ඒකාබද්ධ නාමයන් යටතේ පවතින ඕනෑම මුදලක්, සුරැකුමක්, බැඳුම්කර සහ වෙනත් ඕනෑම වත්කමක්, ලේඛනයක් හෝ දේපොළක් (කවර හෝ ධාරිතාවයක් සහිතව කාඩ්හිමියාට ලබා දී තිබෙන/ ලබා දීමට තිබෙන ඕනෑම කොන්ත්‍රාත්තුවක් අනුව  සිදුවන) මෙම කාඩ්පත් ගිණුම යටතේ කාඩ්හිමියාගේ වගකීම තෘප්තිමත් කිරීම සඳහා වේ. කාඩ්හිමියාට දැනුම් දීමක් සිදු නොකරමින් යුනියන් බැංකුවට හෝ එහි සමූහ සමාගමකට ඇති කාඩ්හිමියාගේ ණය මුදලක් (සැබෑ හෝ අහඹු, ප්‍රාථමික හෝ සම පාර්ශවික හෝ ඒකාබද්ධ සහ හෝ කිහිපයක්) පියවා ගැනීමේ අයිතිය සතුවේ. වෙනත් ඕනෑම ලියවිල්ලක්, ගිවිසුමක් යටතේ ඕනෑම තැන්පතුවක්/ තැන්පතු සැකසීම, අත්හැරීම සහ/ හෝ ඉතිරිව ඇති මුදල් වෙනත් ගිණුමකට/ ගිණුම් වෙත මාරු කිරීම/ ගිණුමෙහි පවතින මුදල් වර්ගයෙන්ම සිදු නොවිය හැකිය. කාඩ්හිමියාගේ බංකොලොත්භාවය, මරණය හෝ වසා දැමීම යන කරුණු මත බැංකුවේ හිමිකම් බලපෑමකට යටත් නොවනු ඇත. ඕනෑම ඒකාබද්ධ ගිණුම් හිමියෙකු සමග මතුවන විරෝධතා මතභේද සමථයකට පත්කරගැනීමේ වගකීම කාඩ්හිමියා සතුවේ.

i. ඉහත සඳහන් කළ හිමිකමට අමරව හෝ වෙනත් ඕනෑම හිමිකමකට යුනියන් බැංකුව සහ එහි සමූහ සමාගම් හිමිකම් කිව හැකි අතර, නීති මෙහෙයවීම, කොන්ත්‍රාත් හෝ වෙනත් ආකාරයකින් කටයුතු කිරීමට බැංකුව සුදුසුකම් ලබයි. (a) යුනියන් බැංකුවේ හෝ එහි සමූහ සමාගමක ශාඛාවක් සමග/ හෝ කාඩ්හිමියාගේ ගිණුම්/ වගකීම් ඕනෑම අවස්ථාවක ඒකාබද්ධ කිරීමට යුනියන් බැංකුවට හැකියාව තිබිය යුතුය. (b) බැංකුව යටතේ ඇති කාඩ්හිමියෙකුගේ ඕනෑම සුරැකුමක් හෝ දේපොළක් අත්හැරීම හෝ විකිණීම මහජන හෝ පුද්ගලික ආකාරයකට අධිකරණ ක්‍රියාවලියකින් තොරව පවතින සුදුසු ආකාරයකට සිදු කිරීමට බැංකුවට හැකියාව තිබෙන අතර කාඩ්හිමියා විසින් යුනියන් බැංකුව හෝ එහි සමූහ සමාගම් සඳහා ගෙවීමට ඇති සම්පූර්ණ මුදල වියදම් ඇතුළුව එම අලෙවියෙන් හෝ

අත්හැරීමෙන් අය කරගත හැක. (c) යුනියන් බැංකුව සහ හෝ එහි සමූහ සමාගමක් එක් මුදල් ඒකකයක් තවත් මුදල් ඒකකයකට පරිවර්ථනය කිරීමේදී මූල්‍ය අනුපාත තීරණය කිරීමේ පූර්ණ අභිමතය දරයි.

20. සාමාන්‍ය

20.1 වෘත්තිය සහ හෝ කාර්යාලීය/ නේවාසික ලිපින හෝ දුරකථන අංක (සබඳතා තොරතුරු) වෙනස් වීමක් පිළිබඳව කාඩ්හිමියා ලිඛිත නිරවද්‍ය තොරතුරු බැංකුවට දැනුම් දිය යුතු අතර, බැංකුව විසින් එම තොරතුරු කාඩ් අයදුම්පත සඳහා යාවත්කාලීන කළ යුතුය.

20.2 කාඩ්පත්හිමියා විසින් බැංකුව වෙත ලබා දුන් නවතම ලිපිනයට ඔහුට/ ඇයට අදාළ දැනුම්දීම් තැපැල් මගින් යොමු කළ යුතුය.

20.3 බැංකුව විසින් විමසන අස්ථාවලදී, කාඩ්හිමියා ඔහුගේ/ ඇයගේ මූල්‍ය තත්ත්වය පිළිබඳ දත්ත බැංකුව වෙත ලබා දිය යුතුය. ලබා දුන් තොරතුරුවල සත්‍ය අසත්‍යතාවය නිශ්චය කරගැනීමට බැංකුව වෙත කාඩ්හිමියා අවසර ලබා දිය යුතුයි. එම තොරතුරු නිසි අවස්ථාවේදී ලබා දීමක් සිදු නොවුණි නම් බැංකුව සිය අභිමතය පරිදි ඉක්මනින්ම කාඩ්පත නැවත අලුත් කිරීම වැළැක්වීම හෝ අවලංගු කිරීම සිදුකරයි.

20.4 බැංකුව විසින් යොමුකරන ලිපි නැවත ලැබෙන හෝ කාඩ්හිමියා සම්බන්ධ කරගත නොහැකි අවස්ථාවලදී අදාළ ප්‍රකාශන හෝ ලිපි ලේඛන අයදුම්පතෙහි සඳහන් අනික් ලිපිනයට යොමු කිරීමට බැංකුවට හැකියාව ඇත.

20.5 වැරදීමකින් කාඩ් ගිණුමට මුදලක් බැරවූ විට ඉහත සඳහන් මුදල නැවත ලබා ගැනීමේ පූර්ණ අභිමතය බැංකුව සතු අතර හෝ කාඩ්හිමියාගෙන් එම මුදල අයකරගැනීමේ හැකියාවද බැංකුව සතුය.

20.6

ගෙවීම් පිළිබඳව බැංකුව විසින් දුරකථන මගින් සිදුකරනු ලබන දැනුවත් කිරීම් සහ කාඩ්හිමියා වෙනුවෙන් දුරකථනයට පැමිණෙන අයෙකු වෙත ලබා දෙන සිහිකැඳවීම් හෝ සිහිකැඳවීමේ එස්එම්එස් දැනුවත් කිරීම් සඳහා කාඩ්හිමියා එකඟ විය යුතුය. කෙසේ නමුත් ගෙවීමට ඇති මුදල් පිළිබඳව කාඩ්හිමියා දැනුවත් කිරීම බැංකුව අවශ්‍යයෙන් කළ යුත්තක් නොවන අතර, ඉහත හිමිකම උපයෝගී කරගනිමින් බැංකුව වෙතින් ප්‍රශ්න කිරීම් සිදු කළ නොහැක.

20.7 ණය ශේෂය බලපැවැත්වීම සඳහා කාඩ් ගිණුම පූර්ව පූරණය කිරීම සඳහා අවසර නොමැති බව කාඩ්පත් හිමියා අවබෝධ කරගත යුතු දෙයක් මෙන්ම එකඟවිය යුතු දෙයකි. එවැනි ණය ශේෂයක්

සඳහා පොලී හිමිකමක් නොමැති බව කාඩ්හිමියා අවබෝධයෙන් සිටිය යුතුය. කෙසේ වෙතත් කාඩ්හිමියා විසින් එවැනි ශේෂයක් පවත්වාගෙන යයි නම්, ඔහු/ ඇය ඒ පිළිබඳ ඉක්මන් ක්‍රියාමාර්ගයක් ගැනීම සඳහා මෙන්ම ඒ පිළිබඳව තොරතුරු දැනුවත් කිරීම සඳහා බැඳී සිටී.

20.8 කාඩ්හිමියාගේ කාඩ් සාමාජිකත්ව භාවිතය මත පැවැත්වෙන හිතෛශීවන්ත/ ප්‍රතිලාභමය වැඩසටහන් වෙනම කොන්දේසි සහ නියම මගින් පාලනය වේ.

20.9 පූර්ව දැනුවත් කිරීම් නොමැතිව සේවා ආයතන දැනුවත් කරමින් කාඩ්පත අත්පත් කරගැනීම සඳහා නිර්දේශ කරමින් අනතුරු ඇඟවීමේ ප්‍රකාශ නිකුත් කිරීමට බැංකුවට පූර්ණ අභිමතය ඇත.

20.10 අලෙවි සහ ප්‍රවර්ධන දැනුවත් කිරීම් තැපෑල, ඊමේල් හෝ එස්එම්එස් මගින් කලින් කලට සිදු කිරීමට බැංකුව කටයුතු කරන අතර එය කාඩ්පත්හිමියාට විශේෂිත දෙයක් නොවීමට හැකියාව ඇත.

20.11 විනිමය පාලක හෝ වෙනත් නියාමන ආයතන විසින් කලින් කල පනවනු ලබන නියාමන අවශ්‍යතාවන්ට අනුකූලව කටයුතු කිරීමට බැංකුව බැඳී සිටින අතර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පවතින රෙගුලාසි යටතේ එම ආයතන වෙත ගනුදෙනු නිරාවරණය කිරීමට කටයුතු කළ යුතුය. ශ්‍රී ලංකා රජය විසින් හෝ වෙනත් විනිශ්චයාධිකරණයක් විසින් කලින් කලට පිහිටුවනු ලබන විනිමය පාලක සහ වෙනත් ඕනෑම නියාමන ආයතනයක් වෙත බැංකුව වාර්තා ලබා දිය යුතු බව කාඩ්පත් හිමියා දැනුවත් විය යුතුය.

20.12 කාඩ් අයදුම්පතෙහි සඳහන් තොරතුරු සත්‍ය අසත්‍යතාවය තහවුරු කරගැනීමේ හිමිකම බැංකුව සතු අතර, නිශ්චිත පාර්ශවයන් වෙතින්/ සඳහා නෛතික හෝ මෙහෙයුම් හේතු මත පෞද්ගලික තොරතුරු රැස්කිරීම/ අනාවරණය කිරීම සිදු කළ හැක.

සේවා පිරිනැමීම සඳහා තුන්වන පාර්ශවයේ සේවා සම්පාදකයන් සම්බන්ධව කාඩ්පත් හිමියා බැංකුව සමග ප්‍රතිඥා දී ඇති අතර එවැනි සේවා සම්පාදකයන් හට පාරිභෝගික දත්ත නිරාවරණය කෙරෙන බව කාඩ්පත් හිමියා අවබෝධ කරගෙන සිටී. එවැනි දත්ත ශ්‍රී ලංකාවෙන් පිටතදී ද භාවිත කෙරෙන බවත් ශ්‍රී ලංකාවේ නොවන අධිකරණ ක්‍රියාමාර්ග සඳහා ඒවා ලක්විය හැකි බවත් කාඩ්පත් හිමියා පතිඥා දෙයි.

21. උල්ලංඝනය! අත්හිටුවීම

21.1 මෙම ගිවිසුමෙහි කිසියම් කරුණක් උල්ලංඝනය වී ඇති බව හැඟී යන ඕනෑම අවස්ථාවක පෙර දැනුවත් කිරීමකින් තොරව ස්ව අභිමතය පරිදි කාඩ්පත අවලංගු කිරීමේ හැකියාව බැංකුව සතුවේ. එමෙන්ම විනිමය පාලන රෙගුලාසි හෝ ව්‍යවස්ථාපිත රෙගුලාසි උල්ලංගඝනයකදීද එම ක්‍රියාමාර්ගය අනුගමය කිරීමට බැංකුවට හිමිකම තිබේ.

21.2 ඕනෑම කාඩ්පත්හිමියෙකු අතින් මෙම ගිවිසුම උල්ලංඝනය විය හැකි අවස්ථාවකදී :

i. මෙම ගිවිසුමෙහි වෙනත් ඕනෑම කොටසක් එසේ වී තිබියදී, එයින් බැංකුව වෙත සෘජුව හෝ වක්‍රව සිදුවන පාඩුව සඳහා ගෙවිය යුතුය.

ii. ඉල්ලීමක් සිදුකරන දිනයේදී එම මුදල් ගෙවිය යුතුද නැතිද යන වග කුමක් වුවත් කාඩ්හිමියා විසින් ගෙවීමට ඇති සියළුම මුදල් බැංකුවට ගෙවීමට බැඳී සිටිය යුතුය.

21.3 ලිඛිත දැනුවත් කිරීමක් මගින් ඕනෑම අවස්ථාවක කාඩ්පත අත්හිටුවීම සඳහා කාඩ්හිමියාට ඉල්ලීමක් කළ හැකි අතර ඊට අනුබද්ධව ප්‍රාථමික කාඩ්පත සහ ඕනෑම අතිරේක කාඩ්පතක් / කාඩ්පත් ලබා දිය යුතුය. කාඩ්පත කොටස් හතරකට කඩා කාන්දම් තීරුව/ EMV චිප් පත කපා දමමින් බැංකුව වෙත ලැබෙන තුරු එවැනි ඉල්ලීමක් බලාත්මක නොවේ.

21.4 කාඩ් ගිණුමෙහි ගෙවීමට ඇති මුළු මුදල සමග වෙනත් ඕනෑම ගෙවීමට ඇති කාඩ් ගනුදෙනුවක් තවමත් කාඩ් ගිණුමට බැර නොවී ඇති විට එම මුළු මුදලම ඉක්මනින්ම මෙම ගිවිසුම අත්හිටුවීම, කාඩ්හිමියාගේ බංකොලොත්භාවය හෝ මරණය මත බැංකුවට ගෙවීමට නියමිත වේ. එවැනි මුදලක් සහ එය නැවත අයකරගැනීමේදී අදාළ වන (නෛතික ගාස්තු ඇතුළු) සෑම වැයක්ම පියවීම සඳහා කාඩ්හිමියා හෝ ඔහුගේ/ ඇයගේ දේපොළ වගකීමට යටත්වේ.

21.5 එවැනි නැවත ගෙවීමක් සිදු නොවී පවතින විට මූල්‍ය ගාස්තු සහ වෙනත් ගාස්තු පවතින අනුපාතයන්ට යටත්ව අයකරගැනීමට බැංකුව සුදුසුකම් ලබයි.

21.6 කාඩ්පතට හිමි වරප්‍රසාද ඕනෑම අවස්ථාවක කිසිදු දැනුම් දීමකින් තොරව තාවකාලිකව හෝ ස්ථිරව ඉවත්කර ගැනීමට/ හෝ අවලංගු කිරීමට යුනියන් බැංකුවට පූර්ණ ස්වයං අභිමතයක් ඇත.

21.7 කාඩ්පත් ගිණුම අත්හිටුවීම සමග යුනියන් බැංකුව සහ කාඩ්හිමියා අතර පෙර පැවැති එකඟතාවයන් අහෝසිවී කාඩ්පත භාවිතා කිරීමේ හිමිකම අවලංගු වේ. ඉන් අනතුරුව ප්‍රකාශනයෙහි සඳහන් වුවත් නැතත් කාලයෙන් කාලයට අදාළ පරිදි ගාස්තු පනවන ලද දින සිට කාඩ්හිමියා ගෙවීමට ඇති සියලුම ගාස්තු සහ පොලී ගෙවීම් කළ යුතුය.

22. වගකීමෙන් බැහැරවීම

කාඩ්පත්හිමියා විසින් සෘජුව හෝ වක්‍රව සිදුකර ගනු ලබන පාඩුවීම්, හානිවීම් සඳහා බැංකුව වගකීම භාර නොගනී.

22.1 වෙළෙන්දෙකු විසින් සපයන යම් කිසි සේවාවක හෝ භාණ්ඩයක කිසියම් දෝෂ සහගත බවක් තිබීම

22.2 කිසියම් පුද්ගලයෙකු/ වෙළෙඳ ආයතනයක් විසින් කාඩ්පතක් භාරගැනීම හෝ ගෞරවයට ලක්කිරීම ප්‍රතික්ෂේප කිරීම

22.3 කිසියම් හෝ හේතුවක් මත ගාස්තුවක් ප්‍රතික්ෂේප කිරීම

22.4 කිසියම් පරිගණකයක් සහ හෝ EDC යන්ත්‍රයක් නිවැරදිව ක්‍රියා නොකිරීම

22.5 කාඩ්පත් හිමියෙකු හැර වෙනත් කිසියම් අයෙකු විසින් ගනුදෙනු උපදේශයක් ලබා දීම

22.6 යුනියන් බැංකුවේ නිර්දේශිත සේවක/ සේවිකාවක නොවන අයෙකු වෙත කාඩ්පත් හිමියා විසින් කාඩ්පත භාරදීම

22.7 කිසියම් අයෙකු විසින් කාඩ්පත නැවත ලබා දෙන ලෙස කරන ප්‍රකාශයක් හෝ එවැනි ඉල්ලීමක් මත කිසියම් අයෙකු සිදුකරන ක්‍රියාවක්

22.8 කල්ඉකුත්වීමට පෙර අලුත් කාඩ්පතක් ලබා ගැනීමට හැකිවන පරිදි හිමිකම් ලබා දෙමින් බැංකුව විසින් කාඩ්පතෙහි මුහුණතෙහි එම දිනය සඳහන් කර ඇත. කෙසේ නමුත් එම සේවාව බැංකුව විසින් සෘජුව හෝ පත්කරන ලද සේවා නියෝජිතායතනයක් මගින් හෝ බැංකුවේ නියෝජිතයෙකු මගින්ද ලබා ගත හැකිය.

22.9 ඕනෑම කාඩ්පතක් හෝ කාඩ්පත් ගිණුමක් අත්හිටුවීම සඳහා බැංකුව සතු හිමිකම ක්‍රියාත්මක වීම

22.10 කිසියම් වෙළෙඳ ආයතනයක් විසින් නැවත ලබා දීම හෝ ප්‍රතික්ෂේප කිරීමක් සිදුකරීම නිසා ණය චරිතයට සහ අයදුම්කරුගේ හෝ කාඩ්පත්හිමියාගේ කීර්තිනාමයට කිසියම් හානියක් ඇතිවීම හෝ කාඩ්පත පිළිගැනීම හෝ ඒ සඳහා ඇණවුම් කිරීම

22.11 යුනියන් බැංකුව විසින් අනාවරණය කරන ලද ඕනෑම තොරතුරක කිසියම් වැරදීමක්, දෝෂසහගතබවක් හෝ අතපසුවීමක්

22.12 යුනියන් බැංකුව හෝ යුනියන් බැංකුව නියෝජනය කරමින් ඕනෑම තෙවැනි පාර්ශවයක් විසින් කාඩ්හිමියාට ගෙවීමට ඇති වන්දියක් පියවීම හෝ ඉල්ලීමක් කරන අවස්ථාවකදී, එම ඉල්ලීම හෝ වන්දිය කිසියම් ආකාරයකින් හෝ ඉහත කාඩ්හිමියාගේ චරිතයට හානි ගෙන දෙන්නක් හෝ ඔහුට/ ඇයට අගතිගාමී වන්නක් නොවිය යුතුය.

22.13 බොහෝ සේවාවන් සන්නිවේදනයන් සහ පිළියෙල කිරීම් තෙවැනි පාර්ශවීය සේවා සැපයුම්කරුවෙකු සහ/ හෝ කොන්ත්‍රාත්කරුවන් විසින් සිදුකරයි. තෙවැනි පාර්ශවීය සේවා සැපයුම්කරු වෙත එවැනි තෙවැනි පාර්ශවීය සැපයුම්කරුවෙකු විසින් හෝ බැංකුව විසින් ගෙවීම් කරනු ලබයි. භාවිතා කරනු ලබන එවැනි සේවාවන් සඳහා වැය වන ඕනෑම වියදමක් කාඩ්හිමියා විසින් දැරිය යුතුයි. හැකි උපරිමයෙන් සහයෝගයන් ලබා දෙන අතර ගැටළුකාරී අවස්ථාවන්, දුර හෝ ස්ථානීය ගැටළු මත ඇතැම්විට ක්‍රියාත්මක නොවිය හැකිය. තෙවැනි පාර්ශවයන් විසින් පත්කරනු ලබන/ නිර්දේශ කරනු ලබන රක්ෂණ, වෛද්‍ය සහ/ හෝ නීති වෘත්තිකයින් ඔවුන්ගේ සේවකයින් හෝ කොන්ත්‍රාත්කරුවන් නොවෙති. එමනිසා කිසියම් රක්ෂණ, වෛද්‍ය, නීති හෝ වෙනත් සේවාවන් ලබාගැනීම, භාවිතය, ක්‍රියාමාර්ග, ප්‍රමාද දෝෂ හෝ ප්‍රතිඵල පිළිබඳව ඔවුහු වගකීමක් නොදරති. සේවාවක් භාවිතය හෝ පිළියෙළ කිරීම සඳහා හෝ ඉහත සඳහන් කළ පාර්ශවයකින් සිදුවන ප්‍රමාද දෝෂයන් පිළිබඳව වගකීමක් බැංකුව විසින් දරනු නොලබයි.

23. අනාවරණය කිරීම්

මෙම 23 වැනි පරිච්ඡේදයෙහි මින් ඉදිරියට දැක්වෙන පරිදි සෑම ගනුදෙනු තොරතුරක්ම හෝ කාඩ්පත්හිමියා සහ බැංකුව අතර සිදුවන ගනුදෙනු පිළිබඳව රහසිගතභාවය බැංකුව විසින් ආරක්ෂා

කරනු ලබයි. කාඩ්හිමියා සහ/ හෝ කාඩ් ගිණුමට සම්බන්ධ තොරතුරු සැපයීම සඳහා කාඩ්හිමියා විසින් බැංකුවට බලය ලබා දෙයි .

23.1 පාරිභෝගිකයින්ගේ දත්ත පදනමක් හෝ ණය ආයතනයක් පාලනය කරන ඕනෑම බැංකුවක් හෝ මූල්‍ය ආයතනයක්, හෝ ණය දෙන ආයතනයක් හෝ පොදු සේවා සැපයුම්කරුවෙක්

23.2 බැංකුව විසින් යෝජනා කළ හෝ සැබෑ පැවරුම්ලාභියෙකු හෝ මෙම ගිවිසුම හෝ කාඩ් ගිණුමට සම්බන්ධ බැංකුවේ ඕනෑම හිමිකමක පැවරුම්ලාභියෙකු හෝ උප සහභාගීවන්නෙකු

23.3 බැංකුව හෝ ඊට අදාළ ඕනෑම සමාගමක රහසිගත තොරතුරු පිළිබඳ සේවා සපයන්නෙක්හෝ කොන්ත්‍රාත්කරුවෙක්

23.4 ඕනෑම නියාමන හෝ අධීක්ෂණ ආයතනයක්

23.5 ශ්‍රී ලංකාවේ පවතින නෛතික රාමුව තුළ එසේ කිරීම සඳහා බලය තිබෙන ඕනෑම අයෙක්

23.6 බැංකුව සමග වාණිජ භාවිතය සඳහා සම්බන්ධ වුන ඕනෑම සමාගමක ඕනෑම ශාඛාවක් හෝ කාර්යාලයක්

23.7 වීසා ඉන්ටර්නැෂනල් අභිමතය සහිත වීසා ඉන්ටර්නැෂනල් සමග සම්බන්ධිත හෝ ඊට අනුබද්ධ ඕනෑම සමාගමක් හෝ ඕනෑම වෙනත් පාර්ශවයක්

24. නීතිය සහ අධිකරණ බලය

මෙම ගිවිසුම ශ්‍රී ලංකාවේ නෛතික රාමුව යටතේ පාලනය විය යුතු අතර ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතියෙහි සුදුසු අධිකරණ බලයට යටත් වේ. කෙසේවෙතත් වෙනත් ඕනෑම රටක ණයක් නැවත ගෙවීම සිදුකරගෙන යාමේ හිමිකම බැංකුවට තිබිය යුතු අතර එවැනි අවස්ථාවකදී වෙනත් ඕනෑම රටක අධිකරණයක් විසින් බලය ඉල්ලා සිටීමටද බැංකුවට හැකියාව තිබිය යුතුය. තවද ශ්‍රී ලංකා මහ බැංකුව හෝ වෙනත් ඕනෑම නියාමන ආයතනයක් විසින් නීතිය, රාජ්‍ය රෙගුලාසි හෝ උපදේශ සංශෝධන සඳහා බලකරන අවස්ථාවක එය ස්වයංක්‍රීයව සංශෝධනය වේ.